# නියමුවා

"සෑම විප්ලවයකින්ම අති විශාල ජන සංඛ්‍යාවක ජීවිත තුළ තියුණු වෙනස්කම් ඇති කෙරෙන්නේය. එවැනි වෙනසක් ඇති වීමට කල් යල් මෝරා තිබේ නම් මිස, නියම විප්ලවයක් සිදු විය නොහැකිය. එසේම, පුද්ගලයෙකුගේ ජීවිතයේ සිදුවන ඕනෑම වෙනසක් ඔහුට බොහෝ දේ උගන්වන, සාරවත් අත්දැකීම් ලබා දෙන සහ බලවත් චිත්ත වේගාත්මක කුහුල් කම් ගෙන එන ලෙසටම, විප්ලවද, කෙටි කාලයක් තුළ මුළු ජනතාවටම සාරවත් හා අගනා පාඩම් උගන්වයි."

ලෙනින්

තෝරාගත් කෘති, 05වැනි වෙළුම, 189 පිටුව

ISSN 1391 - 1031 | 2023 සැප්තැම්බර් | 28 වෙළුම | 01 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=




# දූෂිත ප්‍රභූ පැළැන්තියට එරෙහිව

# පොදු ජනයාගේ ආණ්ඩුවක් හදමු

ලංකේය දේශපාලනයේ තීරණාත්මක පැහැදිලි බෙදුම් රේඛාවක් ඇති වී තිබෙන බවත් හොරකම නතර කරන, හොරකමේ, දූෂණයේ යෙදුණු අයට දඬුවම් දෙන, සොරකමෙන් එක්රැස් කර ගත් ධනය පවරා ගන්නා පාලනය ජාතික ජන බලවේගයේ පාලනය වන බවත් පෙන්වා දෙන ජාතික ජන බලවේගය, දූෂිත ප්‍රභූ පැළැන්තියෙන් රට මුදා ගැනීම වෙනුවෙන් පොදු ජනතාවගේ පාලනයක් පිහිටු විය යුතු බව අවධාරණය කරයි.

ජාතික ජන බලවේගය වෙනුවෙන් නායක අනුර දිසානායක සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 27වැනි දින ජාතික ජන බලවේගයේ බොරැල්ල ආසන සමුළුව අමතමිනි.


මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"අපි තීරණාත්මක බෙදීමකට පැමිණ සිටිනවා. ඔවුන් මේ රට විනාශ කරන කඳවුර, අපි රට ගොඩනගන්න කටයුතු කරන කඳවුර. ඔවුන් සොරකම් කරන අය, අපි සොරකම් නතර කරන අය. ඔවුන් සොරකම් කළ අය ආරක්ෂා කරන අය, අපි සොරකම්වලට දඬුවම් දෙන අය. ඔවුන් ජාතික සම්පත් විකුණන අය, අපි ජාතික සම්පත් ආරක්ෂා කරන අය. ඔවුන් මේ රටේ නීතිය කඩන අය, අපි මේ රටේ නීතිය ආරක්ෂා කරන අය. ඔවුන් ජාතික සමගිය නැති කරන අය, අපි ජාතික සමගිය හදන අය. ලෝකයේ සෑම දියුණු රටකම දියුණුවේ රහස ඒ රටේ සම්පත්, දැනුම, හොඳින් කළමනාකරණය කොට නිෂ්පාදන ආර්ථිකයක් හැදීම. රනිල්ලාගේ මහින්දලාගේ ආර්ථිකය විකුණන ආර්ථිකය. ජාතික ජන බලවේගයේ ආර්ථිකය ගොඩනඟන, හදන ආර්ථිකය. ඔවුන් නියෝජනය කරන්නේ ජාතිවාදය. ඔවුන්ට ඕනෙ ජාතීන් ලෙසට එකිනෙකා අතර වෛරය ක්‍රෝධය, සැකය, පෝෂණය කිරීම. එයාලට සිංහල, දෙමළ, මුස්ලිම් අය අතර සමගියක් අවශ්‍ය නැහැ. අපට සිංහල, මුස්ලිම්, දෙමළ සෑම ජන කොටසකගේම සමාන අයිතිවාසිකම් පිළිගන්නා, සාමකාමී, සහයෝගයෙන් ජීවත් වෙන රටක් අවශ්‍යයි.

ලංකාවේ හැම මැතිවරණයකදීම විවිධ කඳවුරු නිර්මාණය වුණා. ජනතාව බැලුවේ කේන්ද්‍ර දෙකක් දිහා පමණයි. ඒ අය සමත් වුණා සැබෑ ප්‍රශ්න යට ගසා, බොරු ප්‍රශ්න උඩට ගේන්න. ඒ ප්‍රශ්න මත සමාජය දෙකට බෙදනවා. ඡන්ද කාලවලදී, මේ ගොල්ලෝ ප්‍රශ්න නිර්මාණය කරනවා. ජනතාව දෙකට බෙදනවා. ජනතාවගේ පතුලේ ප්‍රශ්න කරළියෙන් පැත්තකට විසිවෙනවා. නමුත් පසුගිය කාලයේ අරගලයක් පැන නැගුණා. ඒ අරගලය පැන නැග්ගේ ජනතාවගේ පීඩාවට එරෙහිව. ලංකාවේ පළමුවෙනි වතාවට ජනතාව තමන්ගේ ඇත්ත **11 වැනි පිටුවට**

## 03 දේශපාලනයේ...

වෙනදා රාජපක්ෂවරුන් බලවත්ව සිටින විට ඔවුන්ගේ ඇගේ එල්ලී ඇමති ධුර කිහිපයක් ලබා ගැනීම අරමුණ කරගෙන දේශපාලනය කළ ගම්මන්පිල, වීරවංශ වැනි කල්ලිද මේ දේශපාලන බිමේ අම්බලමක්වත්...



## 05 ණය ප්‍රතිව්‍යුහගතකරණ...

මෙහිදී බලපෑමක් නොකළ යුතුම ආයතනයට තමයි ආණ්ඩුවේ මේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් බලපෑම සිදුවෙන්න සලස්වා තිබෙන්නේ. ඒ මගින් සේවකයින්ට විශාල පාඩුවක් වෙනවා. සේවක අර්ථසාධක අරමුදලින් ඔවුන්ට වර්ෂයකට පොලී හැටියට ලැබෙන්න තියෙන බිලියන 150කට...



## 09 විද්‍යාවේ ජයග්‍රහණ...

සමාජ ක්‍රමය තුළ විද්‍යාවේ, තාක්ෂණයේ ජයග්‍රහණවල ප්‍රතිඵල පොදු ජනයා වෙත ගලා යන්නේ නැත. ලාභය මත පදනම් වූ, ප්‍රාග්ධනය හිමි හා අහිමි ලෙස බෙදුණු, ප්‍රාග්ධනය හිමි පංතියේ පාලනයක් පවතින සමාජයක විද්‍යාවේ ජයග්‍රහණවලින් එල ලබන්නේ...



තරුණ........ 04
ජාත්‍යන්තර........ 06
ආර්ථිකය ........ 07
කාන්තා........ 08
විශේෂාංග........ 10
වේදිකාව........ 11

**යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!**

# සටන් බිම

# NTUC දිස්ත්‍රික් සමුළු රට පුරා මුළු දෙයි




ජීවන බරට, EPF/ETF කොල්ලයට, බදු බරට, විකිණීමට, මර්දනයට, මැතිවරණ කල් දැමීමට හා අසාධාරණ කම්කරු නීති සංශෝධනයට එරෙහිව ජන බලය ගොඩනගන ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ දිස්ත්‍රික් සමුළු සඳහා වැඩකරන ජනතාව විශාල ලෙස පෙළගැසෙමින් සිටී. පසුගිය මාසය තුළ පමණක් ගාල්ල, රත්නපුරය, කුරුණෑගල, කළුතර, මහනුවර, කෑගල්ල, කොළඹ යන දිස්ත්‍රික්ක ගණනාවක මෙම සමුළු පැවැත්වූ අතර ඒ සඳහා ඉහළ වැඩකරන ජනතා සහභාගිත්වයක් දක්නට ලැබුණු බව ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ලේකම් මහින්ද ජයසිංහ සහෝදරයා පවසයි.

මෙම දිස්ත්‍රික් සමුළු ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති ලාල්කාන්ත, අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, ලංකා ගුරුසේවා සංගමයේ ප්‍රධාන ලේකම් මහින්ද ජයසිංහ, සංවර්ධන නිලධාරී සේවා සංගමයේ ප්‍රධාන ලේකම් චන්දන සූරියආරච්චි යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි. කොළඹ දිස්ත්‍රික් සමුළුව පසුගියදා විහාරමහාදේවී එළිමහන් රංගපීඨයේදී පැවැත්වුණු අතර මේ සඳහා වැඩකරන ජනතාවගේ විශාල සහභාගිත්වයක් දක්නට ලැබුණි.

# EPF/ETF කොල්ලයට හා අසාධාරණ කම්කරු නීතිවලට එරෙහිව විරෝධතා



ආණ්ඩුව විසින් IMF කොන්දේසි අනුව සිදුකරන දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය යටතේ සිදුකරන සේවක අරමුදල් කොල්ලයට හා අසාධාරණ කම්කරු නීති සංශෝධනවලට එරෙහිව පෞද්ගලික අංශය නියෝජනය කරමින් විරෝධතා ක්‍රියාමාර්ග රැසක් ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව විරෝධතා බයිසිකල් පෙළපාලි, ජනතාව දැනුවත් කිරීමේ අත්පත්‍රිකා බෙදාහැරීම්, විරෝධතා බැනරයන් අත්සන් කිරීම් වැනි ක්‍රියාමාර්ග රට පුරා විවිධ නගරයන් හි ක්‍රියාත්මක කෙරිණි. කටුනායක වෙළඳ කලාපය, රත්මලාන කර්මාන්ත ආශ්‍රිත ප්‍රදේශ, කොස්ගම නගරය, කළුතර ආදී නගර කේන්ද්‍ර කරගනිමින් මෙලෙස විරෝධතා බයිසිකල් පෙළපාලි පැවැත්වුණු අතර කොටුව දුම්රියපොළ ඉදිරිපිට, කොම්පඤ්ඤවීදිය, ඇතුළු පෞද්ගලික අංශයේ ආයතන ඉදිරිපිට අත් පත්‍රිකා බෙදාහරිමින් ජනතාව දැනුවත් කිරීම සිදු කෙරිණි. අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් නීතිඥ ජානක අධිකාරී, හෝටල් සේවක මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක ජයතිලක රණසිංහ, වෙළඳ කලාප සේවකයින්ගේ ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු ගාමිණී රත්නායක සහෝදරවරුන්ගේ මූලිකත්වයෙන් මෙම විරෝධතා ක්‍රියාමාර්ග පැවැත්විණි.

# අරමුදල් කොල්ලයට එරෙහිව වතු සේවක විරෝධතා




සේවක අරමුදල් කොල්ලයට හා අසාධාරණ කම්කරු නීති සංශෝධනවලට එරෙහිව සමස්ත ලංකා වතු කම්කරු සංගමය මගින් විරෝධතා ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. ඒ අනුව හැටන්, බලංගොඩ නගරවලදී විරෝධතා බැනරයන් අත්සන් කරමින් ජනතාව දැනුවත් කිරීම් සිදුකරනු ලැබුණි. මෙම විරෝධතා සමස්ත ලංකා වතු කම්කරු සංගමයේ ලේකම් ජේ.එම්.ඒ. ප්‍රේමරත්න, සභාපති කිට්නන් සෙල්වරාජ්, භාණ්ඩාගාරික කේ. කේ. සෙල්වි යන සහෝදර සහෝදරියන්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

# වෛද්‍ය අධ්‍යාපනය විකිණීමට එරෙහිව වෘත්තීය සමිති විරෝධතා




ආණ්ඩුව විසින් පුද්ගලික වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීමේ තීරණයට විරෝධය පලකරමින් ක්‍රියාමාර්ග අරඹන බව සමස්ත ලංකා වෛද්‍ය නිලධාරී සංගමයේ ලේකම් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා පවසයි. නිදහස් අධ්‍යාපනය විනාශ කිරීම සඳහා අවස්ථා ගණනාවක් උත්සාහ ගත් නමුත් යම් හෝ තරමින් මෙම නිදහස් අධ්‍යාපනය රැක ගැනීමට හැකි වී ඇත්තේ පාලකයින්ගේ මෙවැනි උත්සාහයන් ගණනාවක් පරාජය කිරීමට සිසුන්, වෘත්තීය සමිති, දෙමව්පියන් ඉදිරියට පැමිණ කටයුතු කිරීම හේතුවෙන් බවත් වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා පසුගියදා මාධ්‍ය හමුවක් අමතමින් පැවසීය.

ආණ්ඩුව සිදු කළ යුත්තේ රාජ්‍ය අධ්‍යාපනය සඳහා පහසුකම් සපයමින් එම අවස්ථා පුළුල් කරමින් අධ්‍යාපන වරම් අහිමි විශාල පිරිසකට අවස්ථාව සැලසීම බව වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා පවසයි. මුදල් නොමැතිකම නිසා අධ්‍යාපන අවස්ථා අහිමි වන පිරිස වෙනුවෙන් පෙනී සිටින බවත් පුද්ගලික වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීමට එරෙහිව විශ්ව විද්‍යාල සිසුන්, දෙමව්පියන් හා වෘත්තීය සමිති ඒකාබද්ධව දැවැන්ත සටනක් අරඹන බවද මෙහිදී වෛද්‍ය ජයන්ත බණ්ඩාර සහෝදරයා අවධාරණය කළේය.

*ජාතික ජන බලවේගය විසින් 2023.08.23 දින*
*කොළඹ පදනම් ආයතන ශ්‍රවණාගාරයේ පවත්වන ලද '*
*දූෂිත වළල්ලේ ගෝඩ්ෆාදර්ලා සහ බොඩිගාඩ්ලා' සම්මන්ත්‍රණය*

## දූෂණ පිළිකාව ඉවත් නොකර රටට ඉදිරි ගමනක් නැහැ

### ජාතික ජන බලවේගයේ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා




පාලක කණ්ඩායම් එක්ක ස්වාධීන, ප්‍රගතිශීලී, සමාජ ක්‍රියාකාරී වගේ ලේබල් එක්ක සිටි කණ්ඩායම් පෙළගැසෙන්නේ කොහොමද කියලා සමහර රටවල අත්දැකීම්වලින් තේරුම් ගන්න පුළුවන්. සමහර පොතපත කියවලා ඉගෙන ගන්න පුළුවන්. වර්තමානයේ අපි ඒ දේශපාලන පාඩම අත්විඳිමින් සිටිනවා. තීරණාත්මක ලෙස මේ කඳවුරු දෙක ප්‍රධාන සාධක කිහිපයක් මත ගොඩනැගෙනවා.

එකක් වන්නේ වසර 75ක් රට පාලනය කර, දුගීභාවයේ පතුළටම ඇද දැමූ ආර්ථික ප්‍රතිපත්තිය නියෝජනය කරන කණ්ඩායම. ජාතික ධනය ඉතා අතළොස්සක් මත සංකේන්ද්‍රණය වීම නියෝජනය කරන කණ්ඩායම ඒ අයයි. අනෙක් පැත්තේ ජනතාව හවුල් කර ගත් වේගවත්ව රටේ ජාතික ධනය නිෂ්පාදනය කරන සහ එම ධනය ජනතාව අතර සාධාරණව බෙදන නව ආර්ථික විකල්ප යෝජනා ඉදිරිපත් කරන එන්.පී.පී. කඳවුර සිටිනවා. ආර්ථික තලයේ බෙදීම මේක. දේශපාලන තලයේ බෙදීමකුත් තිබෙනවා. වංචාව, දූෂණය, නාස්තිය, පරම්පරාගත දේශපාලනය, නීතියට වඩා උඩින් ඉන්න දේශපාලනය, නීතියට අනුගත නොවන දේශපාලනය යන තත්වයන්ගෙන් සැදුම් ලත් පැරණි දේශපාලන කණ්ඩායම එක පැත්තක ඉන්නවා. වංචාව, දූෂණය නතර කොට නව දේශපාලන සංස්කෘතියකට අපේ රට පරිවර්තනය කරන එන්.පී.පී. කඳවුර අනෙක් පැත්තේ ඉන්නවා. දූෂිත වළල්ලත් එහි ආරක්ෂිතයනුත් එක කඳවුරකට එක්වී සිටිනවා. දූෂිත වළල්ලේ ඒ ගෝඩ්ෆාදර්ලා සහ බොඩිගාඩ්ලාට එරෙහිව දූෂිතයන්ට දඬුවම් දීම සඳහා ගොඩනැගෙන නව කඳවුර එන්.පී.පී. කඳවුරයි. ඉදිරි වසරක පමණ කාලයක ජාතික මැතිවරණයක් පැවැත්වෙන තෙක් මේ කඳවුරු දෙක දිනපතා ධ්‍රැවීකරණය වෙමින් යනවා.

මේ තීරණාත්මක දේශපාලන මොහොතේ කිසිදු පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට ස්වාධීනව ඉන්න බැහැ. ඍජුව හෝ වක්‍රව මේ කඳවුරු දෙකෙන් එකක් තෝරා ගන්න බලකෙරෙනවා. මේ වන විට හැමකෙනාටම මේ දේශපාලන රඟ මඬලේ තමන්ගේ භූමිකාව තෝරා ගන්න බල කෙරී ඉවරයි. අද අපි කතා කරන්නේ මේ ධ්‍රැවීකරණයේ ප්‍රධානම අංශයක් වන දූෂණය ගැන. ඔවුන් දූෂිතයන් සහ දූෂිතයන්ගේ ආරක්ෂකයන්. අප දූෂණය නතර කිරීම සහ දූෂිතයන්ට දඬුවම් කිරීමේ කඳවුර. අද අපේ රට මුහුණ දී තිබෙන දැවැන්තම අර්බුදයේ ප්‍රධානම කොටසක් වී තිබෙන්නේ, මේ දූෂණය. රට බංකොලොත් වීම පතුලේ ආර්ථික ප්‍රතිපත්තිය වගේම දූෂිත පාලනයත් ප්‍රධානම අංගයක් වී තිබෙනවා. පසුගිය කාලයේ ව්‍යාපෘති සඳහා ට්‍රිලියන අටක ණය අරගෙන ඉදිකර තිබෙන්නේ ට්‍රිලියන දෙකක වත්කම් විතරයි. ණය අරගෙන කළ දේවල් 75%ක වත්කම් සොයා ගත නොහැකි නම්, ඒ රට තිබෙන්නේ කොතැනද? විගණකාධිපතිතුමාට යා හැක්කේ රාජකාරි සීමාවේ පමණයි. නමුත් අපි ඒ තොරතුරු සොයා ගන්නවා. ජනතාව අද මුහුණ දෙන ප්‍රධාන ප්‍රශ්නවලට හේතුවත් දූෂණයයි. රටේ ආර්ථිකයට පමණක් නොවෙයි පුරවැසියාගේ එදිනෙදා ජීවිතයේ බෙහෙත්, ආහාර, ඉන්ධන ඇතුළු සෑම අංශයකදීම බලපානවා. ඒ නිසා රට ගොඩනඟනවා නම්, දූෂණය නතර කිරීම ප්‍රධාන තම සාධකයක්. දූෂණය නතර නොකර, මේ රට ගොඩනැගීම ගැන හිතන්නවත් බැහැ.

සමහර අය දූෂණය නතර කර, රට ගොඩනඟන්න බැරි බව කියමින් ජනතාව තුළ බොඳ කිරීමක් කරන්න උත්සාහ කරනවා. තවත් අය කියනවා, දූෂිතයන්ට දඬුවම් දෙන්න බැහැයි කියා. නමුත් ලෝකයේ රටවල්වලින් ඕනෑ තරම් උදාහරණ ගන්න පුළුවන්. විශාල දේශපාලන පරිවර්තන නොවී තිබියදී පවා දඬුවම් දී තිබෙනවා. දූෂිතයන්ගේ බොඩිගාඩ්ලා හැමතැනම ඉන්නවා. දූෂිතයන් වගේම ඔවුන්ව ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයත් අපි හොඳින්ම තේරුම් ගෙන තිබෙනවා. දැන් තිබෙන්නේ දූෂිතයන්ට දඬුවම් දීම වෙනුවට ඔවුන්ව ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයක්. වර්තමාන කඳවුර නියෝජනය කරන්නේ දූෂිතයන් ආරක්ෂා කිරීමයි. අප පිළිබඳව ජනතාවගේ මතය බොඳ කරන්න දූෂිතයන්ට දඬුවම් දිය නොහැකි බවට දැන් මතයක් සමාජගත කරමින් ඉන්නවා. දූෂණය නතර කර, දූෂිතයන්ට දඬුවම් දීම නියෝජනය කරන ජාතික ජන බලවේගයේ කඳවුරට ඉතා හොඳින් එය කළ හැකියි.

## රටක විශාලම හානිය පාලකයා පාලනය වන නීතිය වල්වැදීමයි

### ජාතික ජන බලවේගයේ නීතිඥයෝ සංවිධානයේ විධායක කමිටු සාමාජික නීතිඥ ජේ.එම්. විජේබණ්ඩාර මහතා



අපරාධයක් කළොත් නීතිය හමුවට ගේන්න පුළුවන්. රාජ්‍ය දේපොළ කොල්ල කෑ අයගෙන් අයකර ගන්න පුළුවන්. මෙතෙක් බැරි වුණේ රටේ පවතින සාමාන්‍ය නීතිය පුරවැසියන් රකින අතර, පාලකයන් එය කඩා වැට්ටීම නිසයි. ඒ අනුව අපට පෙනෙනවා පුරවැසියන් පාලනය වන නීතියක් සහ පාලකයන් මෙහෙය වන නීතියක් වශයෙන් කොටස් දෙකක් ක්‍රියාත්මක වූ බවයි. පාර්ලිමේන්තුව පාලනය වන නීතියක්, කැබිනට් මණ්ඩලය පාලනය වන නීතියක්, ජනාධිපතිවරයා පාලනය වන නීතියක් වගේම අධිකරණය පවා පාලනය වන නීතියක් රටේ තිබෙනවා. නමුත් විශාල මට්ටමේ හානි සමාජයට සිදුවෙන්නේ පාලකයා පාලනය වන නීතිය වල්වැදීමෙනුයි. සාමාන්‍ය ජනතාව පාලනය වන නීතියට වඩා එයින් විශාල වශයෙන් හානි සිදුවෙනවා.

පොදු දේපොළ පනත යටතේ සිදුකරන අපරාධවලට නඩු පවරා අදාළ මූල්‍ය අපරාධය මෙන් තුන්ගුණයක් අයකර ගන්නත් පුළුවන්. නමුත් ප්‍රශ්නය වී තිබෙන්නේ පවතින නීතිය හමුවේ පාලකයා පාලනය නොවන විට නීතිය වල්වැදීමයි. ජනාධිපතිත්, මේ ආණ්ඩුවත් නීතියෙන් පාලනය වෙන්නේ නැහැ. පාලකයා නීතියෙන් පාලනය නොවුණහම ආර්ථිකය, සමාජය, සංස්කෘතිය, මුළුමනින්ම කඩාගෙන වැටෙනවා. අපරාධකරුවන් නීතියේ රැහැනට හසුකරන්න බැරි, නීතියෙන් කළ නොහැකි නිසා නොවෙයි. මේ රටේ පාලකයා පාලනය වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, සදාචාරය වැනි නීතිවලින් පාලකයන් පාලනය නොවී අත්තනෝමතික වී තිබෙන නිසයි. සිස්ටම් චේන්ජ් එකේදී පළමුවෙන්ම අපි කරන්නේ පාලකයා නීතියෙන් පාලනය කිරීමයි. ඔහු පනවන නීතිය ජනතාවට වඩාත් සමීප වෙනවා. එයින් ඕනෑම අපරාධකාරයෙක් නීතියේ රැහැනට හසුකරගෙන ඉවත දැමූ නඩු පවා නැවත පනවා මහජනයාගෙන් කොල්ල කෑ ධනය නැවත පවරා ගන්න පුළුවන්. ඒ වෙනුවෙන් අපි සියලු දෙනාම අත්වැල් බැඳගෙන ඉදිරියට යමු.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# විදේශ සබඳතා හා රනිල්

රනිල් වික්‍රමසිංහ පිළිබඳව සමාජය තුළ ගොඩනගා ඇති එක් ප්‍රධාන මිත්‍යාවක් වන්නේ රනිල් වික්‍රමසිංහට ලොව පුරා 'විදේශ සබඳතා' ඇති බවත් ජාත්‍යන්තරය ජයගත හැකි නායකයා රනිල් බවත්ය. මෙය රනිල්ට ආර්ථිකය ගොඩදැමීමට හැකිය යන වර්ගයේම තවත් ප්‍රබන්ධයකි.

ලංකාවේ පසුගිය වසරේ පුපුරා ගිය සමාජ, ආර්ථික, දේශපාලන අර්බුදය අස්සේ රටේ ජනාධිපතිකම රනිල්ට ලැබුණි. රට තුළ මතුවූ අර්බුදයේ එක් විශාලතම පංගුවක් වූයේ ණය බර වැඩි වී විදේශ ණය ගෙවා ගැනීමට නොහැකිවීමත්, අලුතෙන් ණය ගැනීමට නොහැකිවීමත් රට සතුව විදේශ වත්කම් නොමැතිවීමත් විසින් ඇති කළ අර්බුදයයි.

මෙම අර්බුදය තුළ බලයට ආ, විදේශ සබඳතා තිබෙනවායයි කියන රනිල්ට එම සබඳතා යොදා ගනිමින් එකදු රටක් සමග හෝ සාකච්ඡා කර එම රටවලින් ගත් එකම ඩොලරයක් හෝ කපා ගැනීමට තවමත් හැකි වී නැත. ලොව බලගතු රටවල් සමග කිට්ටු සබඳතා තිබුණේ නම් ලංකාවට ණය දුන් රටවල් සමග තනි තනිව කථාකර ණය ප්‍රමාණයක් කපා හැර, ඉතිරිය ගෙවීම කල්දමා 'ණය ප්‍රතිව්‍යුහගතකරණය' පහසුවෙන් කර ගත හැකිව තිබුණි.

එහෙත් සිදුවූයේ ණය ප්‍රතිව්‍යුහගතකරණය සඳහාත් අලුතින් ණයක් ගැනීම සඳහාත් රනිල් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත බඩගෑමය. මූල්‍ය අරමුදල වෙත ගොස් රටට ඉතාම අවාසි සහගත කොන්දේසිවලට එකඟවී මූල්‍ය අරමුදලේ දිගුකාලීන ව්‍යාපෘතියකට අවනත වීමට විදේශ සබඳතා අවශ්‍ය නැත. එය අධිරාජ්‍යවාදී බලවේගවලට රට පාවාදීමට නොපැකිළෙන ඕනෑම කෙනෙකුට කළ හැක. මූල්‍ය අරමුදල වෙත ගොස් එහි සරණ පැතීම කිසිසේත්ම හපන්කමක් හෝ විදේශ සබඳතා පෙන්වන ජයග්‍රහණයක් නොවේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත යාමෙන් පසු පවා දැන් වසරකට ආසන්න කාලය තුළ තවමත් විදේශ ණය කපාහැරීමක් කරගැනීමට රනිල් අසමත්ව සිටී. එසේ නම් විදේශ සබඳතා පිළිබඳ කථා හුදු පම්පෝරි පමණි.

අනෙක් අතින් ලංකාව මුහුණපා ඇති මූල්‍ය අර්බුදයෙන් මිදීමට කිසිම රටක 'උදව්වක්' ගැනීමටද රනිල් සමත්වී නැත. ඒ වෙනුවට රටේ වටිනාම සම්පත් විදේශ බලවතුනට ලබාදීමට කටයුතු කරමින් සිටී. ඒ වෙනුවෙන් යමක් ලැබෙන්නේ නම් ඒවා 'උදව්' නොවේ.

රනිල් වික්‍රමසිංහ ඉන්දියාවට ගොස් සිදුකරගෙන තිබෙන්නේ කුමක්ද? රනිල්ගේ රාජ්‍ය නායකයන් සමග ඇති මිත්‍රත්වය උපයෝගී කරගෙන ඉන්දියාවෙන් විශාල උදව්වක් ගැනීමද? නැත. සැබැවින්ම සිදුකර තිබෙන්නේ ලංකාව ඉන්දියාවේ භූ දේශපාලන වුවමනාව වෙනුවෙන් පාවිච්චි කිරීමට ඉඩ දීමය. එය එක් අර්ථයකින් රට පාවාදීමක්ද වේ.

රනිල් වික්‍රමසිංහ හා ඉන්දියානු අගමැතිවරයා අතර ගිවිසුමක් ඇතිකරගෙන තිබේ. එම ගිවිසුමට අනුව ලංකාව ඉන්දියාවට ක්ෂේත්‍ර 05කින් සම්බන්ධ කිරීමට එකඟවී තිබේ. ඒවානම් විදුලි රැහැන් පද්ධතියකින්, තෙල් හා ගෑස් නල පද්ධතියෙන්, ඉන්දීය මුදල් මගින්, භූමියෙන් (ගුවන්, නාවික ඇතුළු) හා සංස්කෘතික සම්බන්ධතාවලිනි. එවිට ලංකාවේ විදුලිය, ඉන්ධන හා ගෑස් බෙදාහැරීමේ ලොකු පංගුවක් ඉන්දියාවට ලැබේ. මෙය ලංකාවේ ජාතික ආරක්ෂාව පැත්තෙන් බැලුවද ගැටලුවකි. සමහර ක්ෂේත්‍ර විශාල ගැටලුවක් නොවුණත් රටේ බලශක්තිය වෙන රටකට ලබාදීම ගැටලුවක් වේ. ඉදින් මේවා රාජ්‍යතාන්ත්‍රික හපන්කම් හෝ විදේශ සබඳතා පිළිබඳ හොඳ උදාහරණ නොවේ.

රනිල්ගේ විදේශ සබඳතා යනු සැබැවින්ම ඉන්දියාවට හා අධිරාජ්‍යවාදී ආයතනවලට යට වී කටයුතු කිරීමය. යටත් වී රටේ සම්පත් එම රටවලට ලබා දී ඉන් කීයක් හෝ ලබාගෙන දවස ගෙවා ගැනීමය.

සැබැවින්ම විදේශ සබඳතා යනු රටේ 'ස්වාධීනත්වය රකිමින්, ස්වෛරීත්වය රකිමින්, කිසිදු රටක් ළඟ දණින් නොවැටෙමින් තම රටේත් ජනතාවගේත් ගෞරවය ස්වාධීනත්වය ආරක්ෂා කරමින් ලෝකයේ රටවල් සමග හොඳින් ගනුදෙනු කිරීමය. එවැනි විදේශ සබඳතා සහිත පාලනයක් ඉදිරියේදී අප ගොඩනගා ගත යුතුය. එතෙක් රනිල් වැන්නන් පිළිබඳ ගොඩනගන මිත්‍යාවන්ට ගොදුරු නොවී සිටිය යුතුය.

# දේශපාලනයේ අවතැන් වූවෝ



ලංකාවේ දැනට වර්ධනය වී ඇති අර්බුදය හුදු ආර්ථික අර්බුදයක් පමණක් නොවේ. දරුණු ආර්ථික අර්බුදය සමාජ අර්බුදයක් බවටත් එය දේශපාලන අර්බුදයක් බවටත් එම දේශපාලන අර්බුදය පාලක කණ්ඩායම්වල අර්බුදයක් බවටත් පත්ව තිබේ. මේ මොහොතේ ලංකාවේ අර්බුදය ආකාර දෙකකින් මතුව තිබේ. එක් අතකින් පොදු ජනතාවට තවදුරටත් පැරණි ක්‍රමයට ජීවත් විය නොහැකි තරමට අර්බුදය උග්‍රවී ඇති අතර, ඒ නිසාම ඔවුනට අලුත් වෙනසක් පිළිබඳ සිතන්නට බල කෙරී තිබේ. මෙය පහළින් ඇතිවන අර්බුදය ලෙස තේරුම් ගත හැක. අනෙක් අතට ඉහළින් ඇතිවන අර්බුදයක්ද මතුව තිබේ. ඒ, පාලන කණ්ඩායම්වලට තවදුරටත් පැරණි ක්‍රමයට පාලනය ගෙන යාමට නොහැකි වීමේ අර්බුදයයි. ගැඹුරු සමාජ පරිවර්තනයක් සඳහා මේ අර්බුද දෙකම විසින් අවස්ථාවක්ද මතු කරනු ලැබ තිබේ.

මෙහිදී පාලන කණ්ඩායම් මුහුණ දී ඇති අර්බුදය විසින් ඔවුන්ගෙන් විශාල ප්‍රමාණයක් දේශපාලන අවතැන් වූවෝ බවට පත්කරනු ලැබ සිටිති. ඊළඟට බලය ගැනීම හෝ බලයට දායකවීම සඳහා ස්ථානගත විය නොහැකි තරමේ අර්බුදයකට මුහුණ පා සිටින ඔවුන් මේ දිනවල 'තමන්ට තැනක්' සොයමින් දේශපාලන භූමියේ රස්තියාදු වන බව පෙනේ. විශේෂයෙන්ම පවතින රනිල්-රාජපක්ෂ පාලනයට එරෙහිව දැවැන්ත මහජන බලයක් ලෙස ජාතික ජන බලවේගය ගොඩනැගෙමින් තිබීම විසින්ද ඉහත දේශපාලන කල්ලිවල අනාථභාවය වැඩිවී තිබේ.

මේ වන විට ලාංකේය දේශපාලන බිම ඉතාම පැහැදිලි කඳවුරු දෙකකට බෙදෙමින් පවතී. ඒ අනුව මෙරට සියලු පාලනයන්ගෙන් පීඩාවට හා රැවටීමට ලක්වූ පොදු ජනයා, වමේ ප්‍රගතිශීලී ප්‍රජාතන්ත්‍රවාදී කඳවුරක් ලෙස ජාතික ජන බලවේගය වටා එක්වෙමින් එම කඳවුර, විශාල ශක්තිමත් බලයක් බවට පත්කරමින් සිටිති.

ඊට ප්‍රතිපක්ෂව බලයේ සිටි සියලු පක්ෂ හා කල්ලි වමේ, ප්‍රගතිශීලී කඳවුරට එරෙහිව එක අරමුණකට පැමිණෙමින් සිටිති. එහෙත් ඔවුනට තවම එක පෙරමුණකට පැමිණීමට, එක වේදිකාවකට ඒමට නොහැකිවී තිබේ. පවතින දේශපාලන අර්බුදයේ ස්වභාවය එසේය. නැගී එන වමේ, ප්‍රගතිශීලී, ප්‍රජාතන්ත්‍රවාදී මහජන ප්‍රවාහය පැරදවීම සඳහා ඊට එරෙහිව විවිධ තැන්වල සිට කැට කැබිලිති, පොලු මුගුරු ඔසවා සිටින මෙම කණ්ඩායම තුළ අන්ත වාමවාදී, ප්‍රතිවිප්ලවකාරී කල්ලිවල සිට අන්ත ජාතිවාදී, අන්ත දක්ෂිණාංශික කණ්ඩායම් දක්වා වූ පිරිසක් සිටිති. මේ මොහොතේ ලංකාවේ දේශපාලන පෙත සකස් වී ඇත්තේ එසේය.

මෙහි විශේෂය වන්නේ, පසුගිය කාලය පුරා බලයේ සිටි හා බලයේ සිටින කණ්ඩායම් බිඳී විසිරී, අසමගි වී සිටීමය. නැගී එන වමේ ප්‍රගතිශීලී බලවේගය පැරදවීමට සියලු දෙනා අප්‍රකාශිත ඒකඟතාවයක සිට කටයුතු කළද ඔවුන් අතර ඇති විවිධ ප්‍රතිවිරෝධතා නිසාත්, ඔවුනට එකතුවී ජය ගතහැකි මධ්‍යස්ථානයක් ගොඩනොනැගීම නිසාත් දේශපාලන අනාථයන්ගේ තත්වයට පත්ව ඔබ මොබ සැරිසරමින් සිටිති.

මේ වන විට රටේ ප්‍රධාන දක්ෂිණාංශික දේශපාලන ව්‍යාපාරය වූ එ.ජා.ප.ය දෙකට බෙදී දුර්වලව තිබේ. ඉන් පැන නැගුණු එහිම පලුවක් වූ ස.ජ.බ.යද ජනතා ආකර්ෂණයක් නොමැතිව එක තැන පල්වෙමින් සිටී. සමහරු පලු දෙක එකතු කිරීමට උත්සාහ කරද්දී තම තමන්ගේ තනතුරු, මන්ත්‍රී ධුර ගැන සිතමින් තවමත් මෙම පක්ෂ දෙක වෙන වෙනම සිටී. විටෙක ස.ජ.බ. පිරිසක් එ.ජා.ප.යට යන බවට ඉඟි පළවෙන අතර තව මොහොතකින් එසේ නොවන බවද ප්‍රකාශ වේ. ස.ජ.බ. ආණ්ඩු විරෝධී ලෙස පෙනී සිටීමට උත්සාහ කරන අතරම ආණ්ඩුවට සහාය දීමක් ගැනද මත පළ කරයි. ආර්ථික සමාජ ප්‍රතිපත්ති එකම කරගත් එ.ජා.ප. හා ස.ජ.බ. වෙන වෙනම පැවතීමේ දේශපාලන තර්කයක් නැත. එහෙත් බලය පිළිබඳ තනතුරු පිළිබඳව පෞද්ගලික කැදරකම් විසින් ඔවුන් තවදුරටත් බෙදා තබනු ලැබ ඇත. සත්‍යය එයයි.

ඒ අතර පාලන බලය හිමි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ අභිගුණ්ටිකයා නැති නයාගේ තත්වයට පත්ව සිටී. පොහොට්ටුව ගොඩනැගුණේ පක්ෂයක් ලෙසට වඩා රාජපක්ෂවරු කේන්ද්‍ර කරගත් සමූහයක් ලෙසය. දැන් රාජපක්ෂවරු කේන්ද්‍රයෙන් ඉවතට විසිවී සිටිති. එහි ප්‍රතිඵලය වී ඇත්තේ පොහොට්ටුව විවිධ කල්ලිවලට බෙදී යාමය. ඒ තුළ රනිල් දිනවීමට සිතන පිරිසක්ද, බැසිල්ගෙන ඒමට සිතන පිරිසක්ද, මහින්ද සමග 'නැගිටීමට' තවමත් උත්සාහ කරන පිරිසක්ද, ශ්‍රීල.නි.ප.යට රිංගා එහි බලය අල්ලාගෙන රනිල් සමග ඒකගතාවයකට ඒමට සිතන පිරිසක්ද, ආදී වශයෙන් එකිනෙකට අසම්බන්ධිත කණ්ඩායම් කිහිපයක් නිර්මාණය වී තිබේ. එහි ප්‍රතිඵලය වී ඇත්තේ පාර්ලිමේන්තුවේ බලය තිබුණද, පොහොට්ටුව මහජන බලය අහිමි වී බෙදී ගිය කණ්ඩායමක් බවට පත්වීමය.

වෙනදා රාජපක්ෂවරුන් බලවත්ව සිටින විට ඔවුන්ගේ ඇගේ එල්ලී ඇමති ධුර කිහිපයක් ලබා ගැනීම අරමුණ කරගෙන දේශපාලනය කළ ගම්මන්පිල, වීරවංශ වැනි කල්ලිද මේ දේශපාලන බිමේ අම්බලමක්වත් නොමැති අවතැන් වූවන් බවට පත්ව තිබේ. පොහොට්ටුවෙන් කැඩී ගිය ඩලස් ඇතුළු පිරිසද සිටින්නේ මෙම දේශපාලන බේදවාචකයටම මුහුණදීය.

ඒ අතර, අර්බුදය මැද තමන්ට පොදු අපේක්ෂකයාගේ භූමිකාව ලබාගත හැකි යැයි සිතමින් සිටි සරත් ෆොන්සේකා, චම්පික රණවක වැනි අයද මේ දේශපාලන බිමේ අනාථයෝ වී සිටිති. ඉදිරි දේශපාලන සටනට පැරණි නිර්පාක්ෂික පොදු අපේක්ෂක සංකල්පය ගැලපෙන්නේ නැත. දැන් එය යල් පැන ගොසිනි. රනිල් ප්‍රමුඛ ප්‍රභූ පංතියේ හා ප්‍රතිගාමී කඳවුරේ 'පොදු අපේක්ෂකයා' ලෙස දැනටමත් රනිල් වික්‍රමසිංහ පෙනී සිටී. ඉදිරියේ යම් වෙනසක් ඇති වුවත් දැනට ප්‍රතිගාමී කඳවුරේ පොදු අපේක්ෂකයා ලෙස සිටින්නේ රනිල්ය.

එහිදී රනිල් පැරදවීමට තවදුරටත් පොදු අපේක්ෂකයෙක් අවශ්‍ය නොවන තත්වයක් ඇති වී තිබේ. ඒ, ජාතික ජන බලවේගය, රනිල් ප්‍රමුඛ ප්‍රතිගාමී නඩයම පැරද විය හැකි ශක්තිමත් ජනතා ව්‍යාපාරය ලෙස ගොඩනැගී තිබීමය. ඒ නිසා වමේ ප්‍රගතිශීලී කඳවුරේ අපේක්ෂකයා මාලිමාවේ නායක අනුර දිසානායක සහෝදරයා ලෙස දැනටමත් සමාජ ගතවී අවසන්ය. පැරචුට් පොදු අපේක්ෂකයන්ට අවස්ථාවක් නැතිව ගොස් ඇත්තේ මෙම දේශපාලන වටපිටාව තුළය.

දැන් මෙරට දේශපාලන බිමේ අවතැන් වූවෝ, දුෂ්ටයෝ, විකටයෝ ආදී සියලු දෙනා තමනට තැනක් සොයමින්, ඒ අතරම ජාතික ජන බලවේගය වෙත කැට කැබිලිති විසිකරමින් සිටිති. සමහරු ජාතික ජන බලවේගය යළි පොදු අපේක්ෂකයෙක් ගෙන ඒමේ දේශපාලනයට ගෙන ඒමටද සිතති. එහෙත් අතීත දේශපාලනය දැන් වෙනස් වී ඇති බවත්, අපේ සමාජය ප්‍රධාන කඳවුරු දෙකකට බෙදී තිබෙන බවත් තවමත් ඔවුනට නොතේරේ. ඒ, ඔවුන්ගේ දේශපාලන කියවීමේ ගැටලුවකි. කෙසේ වෙතත් ඉදිරි දේශපාලන සටන විසඳෙනු ඇත්තේ ප්‍රභූ හා සකල විධ ප්‍රතිගාමීන්ගේ කඳවුරත්, වමේ ප්‍රගතිශීලී කඳවුරත් අතර සටනින් වමේ ප්‍රගතිශීලී කඳවුරේ ජයග්‍රහණය මගින් මහජනතාවගේ බලයක්, මහජනතාවගේ පාලනයක් බිහිවීමෙන් බව නම් ඉතා පැහැදිලිය.

> වෙනදා රාජපක්ෂවරුන් බලවත්ව සිටින විට ඔවුන්ගේ ඇගේ එල්ලී ඇමති ධුර කිහිපයක් ලබා ගැනීම අරමුණ කරගෙන දේශපාලනය කළ ගම්මන්පිල, වීරවංශ වැනි කල්ලිද මේ දේශපාලන බිමේ අම්බලමක්වත් නොමැති අවතැන් වූවන් බවට පත්ව තිබේ. පොහොට්ටුවෙන් කැඩී ගිය ඩලස් ඇතුළු පිරිසද සිටින්නේ මෙම දේශපාලන බේදවාචකයටම මුහුණදීය.






YES WE CAN

# ඉන්දීය බලහත්කාරය හා රනිල්ගේ අසමත්කම

ඉන්දීය ආරක්ෂක ඇමති රාජ්නාත් සිං සැප්තැම්බර් මුල කඩිමුඩියේම ලංකාවට පැමිණීමට නියමිතව තිබූ නමුත් ප්‍රකාශ නොවූ හේතුවක් නිසා එය කල් ගොස් තිබේ. එහෙත් ඔහු සමග පැමිණීමට නියමිත වූ 'අයි.එන්.එස්.දිල්ලි' නැමති යුද නෞකාව ලංකාවට පැමිණියේය. ඔහු පැමිණීමට නියමිතව ඇත්තේ ඉන්දු - ශ්‍රී ලංකා ආරක්ෂක එකඟතාවයන් ගැන නැවත සමාලෝචනය කිරීමට හා ඒවා නැවත ශක්තිමත් කරගැනීමට බව ඉන්දීය ආරක්ෂක අමාත්‍යාංශය පවසයි.

ඉන්දියාවට මෙසේ හදිසියේම ඉංදු-ලංකා ආරක්ෂක සහයෝගීතාව මතක් වූයේ වූයේ නිකම්ම නොවන බව අප තේරුම් ගත යුතුය. ෂියෑන්-6 චීන පර්යේෂණ නෞකාවට ඔක්තෝම්බර් මාසයේ ලංකාවට පැමිණීමට හා අපේ මුහුදේ දින 17ක් ගවේෂණ කටයුතුවල නියැලීමට අවසර ලබා දීම, ඉන්දියාවේ මෙම කඩිමුඩියට ආසන්නතම හේතුවයි. එසේම මෙම චීන නෞකාවේ පැමිණීම කල්දමන ලෙස ඉන්දියාව ලංකාවෙන් ඉල්ලීමක් කර ඇත්තේ, තම බලහත්කාරී ආධිපත්‍යය ලංකාව මත මුද්‍රාහරිමිනි.

මෙසේ ඉන්දීය බල ආධිපත්‍යය ලංකාව මත මුද්‍රාහරින්නේ ඉන්දියන් සාගරයේ තම වෙළඳාම චීනය විසින් අත්පත් කරගන්නා නිසාවෙනි. ඒ වෙනුවෙන් චීනය, 'එක් මාවතක්, එක් තීරයක්' නැමති උපායමාර්ගික සැලසුම ඉන්දියන් සාගරය තුළ ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික භූමියක් ලෙස ලංකාව තොරාගෙන, කටයුතු කරමින් සිටියි.

මෙම ඉන්දු-චීන දේශපාලනික හා ආර්ථික ප්‍රතිවිරෝධය රනිල් වික්‍රමසිංහ භාවිතා කරන්නේ, තමා මුහුණ දී සිටින බලය ලබාගැනීමේ ඉතා පටු වුවමනාව ජයග්‍රහණය කරගැනීමටය. ඒ වෙනුවෙන් රනිල් රටේ ආර්ථිකය, රට චීනයට මෙන්ම ඉන්දියාවට මෙන්ම බටහිර අධිරාජ්‍යවාදී වුවමනාවන්ට අනුව ක්‍රියාත්මක කරමින් සිටියි.

එක් පසෙකින් නැගෙනහිර පළාතේ සංවර්ධන කටයුතු ඉන්දියාවට පවරන්නේ ලාංකේය දේශපාලනයේ ඉතා තීරණාත්මක ඉන්දීය වුවමනාවක් වෙනුවෙනි. 1987 අත්සන් කළ ඉන්දු-ලංකා ගිවිසුම අනුව උතුරු නැගෙනහිර එක් පළාතක් බවට පත් කළේ ඉන්දියාවේ උපායමාර්ගික දේශපාලන වුවමනාවන්ට අනුවය. නැවත සිදුවන්නේ එයම නොවේද?

1987 ඉන්දු-ලංකා ගිවිසුමට අනුව පවරාගත් ත්‍රිකුණාමලයේ පිහිටා ඇති තෙල් ටැංකි සංවර්ධනය වන්නේ, ඉන්දියානු වෙළෙඳපොළ ව්‍යාප්ත කිරීමේ වුවමනාව අනුව නොවේද? එම ආර්ථික ව්‍යාප්තවාදය තවත් පුළුල් කරමින් තෙල්, ගෑස් සැපයීමේ නලයක් ඉන්දියාවේ සිට ඉදිවන්නේය. මන්නාරම හා ඉන්දියාව යා කරමින් පාලමක් ඉදි වන්නේය.

එපමණක්ද නොවේ, සුළං බලයෙන් මෙගා වොට් 56,000ක විදුලි ධාරිතාවයක් නිපදවිය හැකි ප්‍රදේශයක් වන මන්නාරම් බොක්ක ආශ්‍රිත ප්‍රදේශය විදුලිබල උත්පාදනය වෙනුවෙන් අදානි සමාගම් වෙත පවරන්නේ මෙම ආර්ථික ව්‍යාප්තිය තවත් පුළුල් පරාසයක් දක්වා විහිදුවමිනි.

මෙසේ එක් පසෙකින් චීනයටත්, අනෙක් පසින් ඉන්දියාවට සහ බටහිර අධිරාජ්‍යවාදයටත් අපේ රට ඉතා තීරණාත්මක භූමියක්, පොර පිටියක් බවට පත් කිරීමට රනිල් රාජපක්ෂ පාලනයේ බල වුවමනාවන් ක්‍රියාත්මක කිරීම අනාගත ශ්‍රී ලංකාව වඩා සංකීර්ණ හා බරපතළ අනතුරකට ඇද දමනු නොඅනුමානය.

# පෙරළා කියවමු කියවා පෙරළමු...

ලතෙත් මිහිරිය
ලොවක් තැනුමෙන්...
අපත් හැම දෙන
ලදින් නැණුවන
පසක් කරනට
දනන් ලොව වෙත...
හුදෙක් කියවුම
මිසක් වරදක්
වෙනස් කරනට
ලොවක්, අරමුණු
අහස් කුස ඇඳි
මහත් දුක් පොදි
එකත්පස් හිඳ
නොහැකි නිවනට
පසක් කළ යුතු
බොසත් ගුණ ඇත..
කවක්, ගීයක්
පොතක්, ප්‍රේමය
දහස් වරකුත්
වෙතත් කියවුම
සමත් දිනුමට
වෙනස් කෙරුමට
අපිත් ගෙනැවිත්
පොතක් පෙරළා
හිතක් පෙරළමු..

(සාහිත්‍ය මාසය වෙනුවෙනි)



# මලෙයහ ජනතාවට වසර 200යි



මලෙයහ යනුවෙන් හඳුන්වන්නේ දෙමළ භාෂාවෙන් කඳුකරය කියන වචනයටය. කඳුකරයට ආ ජනතාවට මලෙයහවරුන් ලෙස හඳුන්වනවා. මෙලෙයහවරුන් හෙවත් ඉන්දියානු සම්භවයක් සහිත දමිළ ජනතාව ලංකාවට එන්නේ බ්‍රිතාන්‍ය පාලන සමයේදීය. අපේ රටේ තේ වගාව ඇරඹි බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ශ්‍රමිකයන් ලෙස මුල්ම මලෙයහවරු ලංකාවට ගෙන එන ලදහ. දහස් සංඛ්‍යාත දෙමළ ජනතාව මන්නාරම වෙරළ තීරයේ සිට නොයෙක් පීඩා මධ්‍යයේ මාතලේට සැතපුම් සිය ගණනක් පා ගමනින් ගෙන එන ලදහ. එහිදී විශාල පිරිසක් විවිධ පීඩාවලට ලක්වෙමින් මරණයට පත්වූහ. එදා සිට අද දක්වා වසර 200ක කාලයක් ගතවී ඇති නමුදු අද වන විට පරම්පරා 04ක් 5ක් ගෙවී ගොස් ඇති නමුදු මේ වනතෙක් බොහෝ පිරිසකට පුරවැසිභාවය පවා ලැබී නොමැත.

පසුගිය අගෝස්තු 09 වැනිදාට මලෙයහවරුන් පැමිණ වසර 200ක් ගත වීම නිමිත්තෙන් මන්නාරමේ සිට මාතලේ දක්වා දවස් කිහිපයක පාගමනක් සූදානම් කර තිබිණි. මෙහිදී ඔවුන්ගේ ඉල්ලීම් වූයේ අනෙකුත් ජනතාවට මෙන්ම ඔවුන්ටත් සමාන අයිතිවාසිකම් සහිත ලංකාවේ ජන කොට්ඨාසයක් ලෙස පිළිගැනීමත්, ජීවත් වීමට සරිලන වැටුපක් ලබා දීමත්ය. මෙරට ප්‍රගතිශීලි ජනතාව විසින් සංවිධානය කරන ලද මෙම පාගමනට සමාජවාදී තරුණ සංගමයද සහභාගි විය.

# මාවුස්සාකැලේ දූපතක් හා අධිසංවේදී රක්ෂිත විදෙස් සමාගමකට



මාවුස්සාකැලේ ජලාශයේ දූපතක් හා අධිසංවේදී පරිසර රක්ෂිත විදෙස් සමාගමකට ලබා දීමට ආණ්ඩුව විසින් මේ වන විට සැලසුම් කරමින් සිටින අතර මේ පිළිබඳ නිරීක්ෂණයට පසුගිය අගෝස්තු 15 දින සමාජවාදී තරුණ සංගමය සහ පරිසර සංවිධානවල සාමාජික පිරිසක් එහි සංචාරයක නිරත වූහ.

මෙහිදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික මලින්ද ජීවන් සහෝදරයා අදහස් දැක්වීය.

"ශ්‍රී පාද අභය භූමිය කියන්නේ ජල පෝෂක ප්‍රදේශයක් වගේම, අධි සංවේදී පරිසර කලාපයක්. මේ කලාපයේ දැනට ලංකා විදුලිබල මණ්ඩලය භාරයේ පවතින මාවුස්සාකැලේ ජාලාශයට යාබද ඉඩම් කොටසක් හා ජලාශය තුළ පිහිටා ඇති දූපතක්, දිගුකාලීන බදු පදනම යටතේ ලබා දීමට ආණ්ඩුව සැලසුම් කර තිබෙනවා.

සෘජු විදෙස් ආයෝජනයක් ලෙස ඩොලර් මිලියන 25ක් යෙදවීමෙන් සුඛෝපභෝගී හෝටල් ව්‍යාපෘතියක් සඳහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ කැපිටල් ඉන්වෙස්ට්මන්ට් එල්.එල්.සී සමාගමට ලබා දීමට, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා වන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා තමයි මෙම යෝජනාවට අමාත්‍ය මණ්ඩල ඇනුමැතිය ලැබුණු බව පසුගිය ජුනි 26 දින ප්‍රකාශ කරන්නේ.

මාවුස්සාකැලේ ජලාශය යනු අක්කර අඩි 95,000ක පමණ ජල ධාරිතාවයක් සහිත ජලාශයක්. ලක්ෂපාන, නව ලක්ෂපාන, පොල්පිටිය, ඇතුළු ජල විදුලි බලාගාර කිහිපයකට ජලය ලබා දෙන්නෙත්, කැළණිය ගඟට ජලය ලබා දෙන්නෙත් මෙම ජලාශයෙන්. මෙවැනි අධි සංවේදී පරිසර කලාපයක් තුළ කිසියම් ආයෝජනයක් සිදු කරන්නේ නම් එම ආයෝජන වාර්තාව ජනතාවට ඉදිරිපත් කළ යුතු අතර ජාතික පාරිසරික පනත අනුව ඊට අදාළ පරිසර තක්සේරු වාර්තාවක් ලබා ගැනීම අනිවාර්යයි. නමුත් තවමත් එවැනි කිසිම වාර්තාවක් ජනතාවට ඉදිරිපත් කර නැහැ.

මෙහි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනයට සංවර්ධන කටයුත්තක් සිදු කරන්නේ නම් සිදු කළ යුතු වන්නේ ඊට අදාල නිසි ක්‍රමවේදයට හා විනාශය අවම කරගෙනයි. ඒවගේම සංචාරක ක්ෂේත්‍රය ප්‍රවර්ධනයට භාවිතා කළ හැකි ලෙස පරිසරය, සතා සිව්පාවා ආරාක්ෂා කරගෙන සිදු කිරීම විනා ඒවා විනාශ කිරීම නෙවෙයි.

ඒ නිසා මෙම අධිසංවේදී පරිසර කලාප විනාශයට එරෙහිව කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ වගේම මේ පිළිබඳව පරිසරයට ආදරය කරන තරුණ තරුණියන් සහ මහජනතාව දැනුවත් කිරීමට බලාපොරොත්තු වෙනවා"

# ක්‍රීඩාව විනාශ කළ ගජ මිතුරු කල්ලිය පරදවමු!



"ශ්‍රී ලංකා ක්‍රිකට් ඇතුළු අනෙකුත් ක්‍රීඩාවන්ට සිදු කෙරෙන දේශපාලන බලහත්කාරය නවතනු!" මැයෙන් පෙත්සමක් සහ විරෝධතා බැනරය අත්සන් කිරීමේ වැඩසටහනක් පසුගිය අගෝස්තු 28 දින කොටුව දුම්පරියපොළ ඉදිරිපිට දී පැවැත්විණි. මෙය Save the Sports මගින් සංවිධානය කර තිබුණි.

මෙහිදී සමාජවාදී තරුණ සංගමයේ ජාතික සංවිධායක එරංග ගුණසේකර, ජාත්‍යන්තර කටයුතු ලේකම් අංජන අමරසිංහ හා ජාතික සවිබර එසවීමේ ක්‍රීඩක ධූවී නුලේෂ්‍යා අදහස් දැක්විය.

එහිදී එරංග ගුණසේකර සහෝදරයා විසින් මෙලෙස අදහස් දැක්විය.

"අද අපි Save the Sports සංවිධානයත් එක්ක අපේ රටේ ක්‍රීඩාවට ආදරේ කරන තරුණයෝ ඇතුළු තරුණයන් එක්ක පාරට බැහැලා ක්‍රීඩාව දේශපාලන බලපෑම්වලින් මුදා ගන්නත්, අනිත් පැත්තෙන් අවුරුදු ගණනාවක් තිස්සේ ගජමිතුරු කල්ලියක් විසින් ක්‍රිකට් පාලක මණ්ඩලය අත්පත් කරගෙන සිටීමට එරෙහිවත් තමයි මෙම වැඩසටහන සංවිධානය කළේ. අද අපේ රට අපකීර්තිමත් රාජ්‍යයක් බවට පත් වෙලා තියනවා. ඒ අපේ රටේ මිනිස්සු හින්දවත් ක්‍රීඩකයෝ හින්දවත්, ස්වභාවික ආපු ආපදාවක්වත් නිසා නෙවෙයි. අවුරුදු හැත්තෑ පහක් තිස්සේ අපේ රටේ පාලකයෝ කරපු විනාශය තමයි මෙහෙම වෙලා තියෙන්නේ. ඒකෙ ප්‍රතිඵලයක් විදිහට තමයි ක්‍රිකට් ක්‍රීඩාවට, රග්බි ක්‍රීඩාවට මේ ඛේදවාචකය අත්වෙලා තියෙන්නේ.

රටට ජයග්‍රහණයක් නැති වෙලාවක ක්‍රීඩාවෙන් තමයි යම් හෝ ජයග්‍රහණයක් මිනිසුන්ට ලැබෙන්නේ. හැබැයි එහෙම තියෙද්දි තමයි එහි ඇති මුදල් ටිකට, ගජමිතුරු කල්ලියක් විසින් ගේම දෙන්න පටන් අරගෙන තියෙන්නෙ. විගණකාධිපති වාර්තාවේ සටහන් වෙනවා, ටී ටුවෙන්ටි තරගාවලියේදී මිලියන 60ක මූල්‍ය වංචාවක් සිදුවෙලා කියලා. දැන් සමාජය තුළ, පාර්ලිමේන්තුවේ ඇතුලේ කතා කරන්න පටන් අරන් තියනවා, මේක ඇතුලේ ඉන්න ගජ මිතුරු කල්ලිය, මජර විදියට එහි මුදල් වෙන් කරගෙන තියනවා, හැබැයි ටී ටුවෙන්ටි තරගයේ විතරක්, රුපියල් මිලියන 60ක් කාබාසිනියා කරද්දි, මේ මෑත කාලේදී රිටි පැනීමේ ක්‍රීඩිකාව තමන්ගේ ක්‍රීඩා කටයුතු කරගන්න බැරිව ගෘහ සේවය සඳහා අපේ රටින් පිටට යනවා. එතනට තමයි අපේ ක්‍රීඩාව ඇවිත් තියෙන්නේ.

අපි බලධාරීන්ට කියනවා, ක්‍රීඩාවට කරන දේශපාලන බලපෑමත්, ක්‍රීඩා මණ්ඩල මගින් ගජමිතුරු කණ්ඩායමත් පවත්වාගෙන යෑම වහා නතර කරන්න ඕනෑ. ක්‍රීඩා ඇමතිවරයා ක්‍රීඩාවට, අපේ රටේ ජනතාවට, මුදල්වලට වග කියන්න ඕනේ. එහෙම නැතුව මීඩියා ඉස්සරහ ඇවිත්, තමන්ගේ බැරිකම් කියන්න හදන්න එපා. මේ ඒ පාලකයන්ට රටක් ගොඩනගන්න බැහැ වගේම, මේ ක්‍රීඩාව ආරක්ෂා කරන්න බැහැ. ක්‍රිකට් ක්‍රීඩාව විතරක් නෙවෙයි පාපන්දු සම්මේලනය දූෂණ වංචා නිසා තහනම් කරලා. ඔවුන්ට ජාත්‍යන්තර තරගවලට සම්බන්ධ වෙන්න බැහැ, ඒ වගේම කබඩිවල තියන දූෂණ වංචා නිසා කබඩි ජාත්‍යන්තර මැච් ගහන්න අපිට බැහැ. ඒ නිසා අපි තරුණ තරුණයින්ට කියනවා නිකම් බලාඉන්නේ නැතුව හඬ අවදි කරන්න කියලා. ක්‍රීඩාවට බලපෑම් කරන මේ දේශපාලන කණ්ඩායම්, ගජමිතුරු කල්ලිය වහාම පලවා හැරලා මෙ ආයතන ස්වාධීන කරන්න කියන බලපෑම කරන්න කියලා."




## කෝපි වෙනුවට පානය කරන ජනප්‍රිය පානය 'චිකරි'



ශතවර්ෂ ගණනාවකට පෙර භාවිතයට ගත් ඖෂධීය ශාකයකි. චිකරි Chicory (Cichorium intybus) යනු යුරෝපයට සහ ආසියාවට ආවේණික පැළෑටියකි. මෙම ශාකය එක්සත් ජනපදයේද වගා කෙරේ. චිකරි මූලයේ පිෂ්ඨමය ද්‍රව්‍යයක් වන වන අතර එහි ඉනුයුලින් අඩංගු වේ. මෙය බීටා - කැරොටින් යන රසායනික ද්‍රව්‍යයන්ගේ පොහොසත් ශාක ප්‍රභවයකි.

මෙම විස්මිත ශාකය විවිධ රෝගයන්ට ප්‍රතිකාර කිරීම සඳහා හොඳින් උපකාරී වේ. මෙම ශාකය විකිරණශීලී මූලයන් නිපදවන විෂ ශරීරයෙන් පිටවීම ප්‍රවර්ධනය කරන අතර හානිකර අපද්‍රව්‍ය ඉවත් කර ලේ පවිත්‍ර කරයි. මිනිස් ශරීරයේ ඇති වන ඉදිමීම් අඩු කරන අතර විරේකයන් සඳහාද භාවිතා කරයි. එය වර්තමානයේ ඉතා ජනප්‍රිය පානයක් වන අතර, එය චිකරි කෝපි ලෙස හැඳින්වේ. මෙය බොහෝ විට සාමාන්‍ය කෝපි වෙනුවට කැෆේන් නොවන පානයක් ලෙස භාවිතා කෙරේ.

## පිළිකා නොවැළදෙන, පරමායුෂ විඳින හුන්සා මිනිස්සු



1970 ගණන්වල මුල් භාගයේදී, නැෂනල් ජියෝග්‍රැෆික් විසින් ලොව පුරා දිගු කලක් ජීවත් වූ පුද්ගලයින්ගේ ප්‍රකාශයන් විමර්ශනය කරමින් පුළුල් ලිපි මාලාවක් ඉදිරිපත් කරන ලදී. උතුරු පකිස්තානයේ හුන්සා නිම්නයේ ජීවත් වූ හුන්සා ජනතාව එම ජනවර්ග අතරින් එකකි. ඔවුන් ජීවත් වන අද්විතීය කලාපය පිළිබඳ හැදෑරීම සිත් ඇදගන්නා සුළු සිද්ධි අධ්‍යයනයන් බවට වර්තමානයේ පත් වී ඇත.

හුන්සා ගෝත්‍රිකයෝ කිසිදා පිළිකා රෝගයෙන් පීඩා විඳ නොමැති බව පැවසේ. වයස අවුරුදු 120 ක් ආයු වැළඳීම ඔවුන් අතර ඉතා සුලබ දෙයකි.

## අප්‍රිකා මහද්වීපයේ පාවෙන ගෙවල්



අප්‍රිකා මහද්වීපයේ බෙනින් ජනරජයේ දකුණු කොටසේ, කොටනවු වරාය නගරයට ආසන්නයේ අප්‍රිකාවේ විශාලතම පාවෙන ගම්මානය පිහිටා ඇත. එය හදනදමඞී විල මැද පිහිටා ඇති අතර 17වැනි සියවස දක්වා දිවෙන කෘත්‍රිම දූපත් වටා සකස් කර ඇති වර්ණවත් ලී කණුවලින් සංරක්ෂිත වේ.

මෙම අද්විතීය ගෘහනිර්මාණ ශිල්පය උපත ලැබුවේ ටොෆිනු ගෝත්‍රික ඉතිහාසයෙන් වන අතර එය වහල් වෙළඳාමෙන් රැකවරණයක් ලෙස ගොඩනගා ඇති අතර දැන් එය ගෝලීය සංචාරක ආකර්ෂණයක් බවට පත්ව ඇත. මෙම ගම්මානය 1996 දී යුනෙස්කෝව විසින් ලෝක සංස්කෘතික උරුමයක් ලෙස පිළිගනු ලැබූ අතර වාර්ෂිකව විදේශීය නරඹන්නන් 10,000ක් පමණ ආකර්ෂණය කර ඇත.

පාවෙන ගම්මානයේ මිනිසුන් 45,000ක් පමණ වාසය කරන අතර නේවාසික නිවාස බොහෝ දුරට ලී කණුවල සම්ප්‍රදායික ක්‍රම භාවිත කරන අතර පාසල් සහ ආගමික ස්ථාන වැනි පොදු ගොඩනැගිලි නවීන ක්‍රම කොන්ක්‍රීට් කණු සහ වැලි කොන්ක්‍රීට් කුට්ටිවලින් ඉදිකරනු ලැබ ඇත.

# ණය ප්‍රතිව්‍යුහගතකරණ වැඩපිළිවෙළ
# බරපතළ සේවක අරමුදල් කොල්ලයක්

***නියමුවා:- EPF, ETF අරමුදල්වල ආයෝජන කියන්නේ මොනවද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** රටේ විශ්‍රාම වැටුපක් නැති විශේෂයෙන් අර්ධ රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ සේවකයින්ට ඒ අයගේ විශ්‍රාම සමය එහෙම නැත්නම් ජීවිතයේ සැඳෑ සමය ගතකිරීම සඳහා ඒ අයගේ වැටුපෙනුත් හාම්පුතාගේ දායකත්වයකුත් සමග ඒකාබද්ධව හැදෙන අරමුදලක් තමයි මේ සේවක අර්ථසාධක අරමුදල සහ භාරකාර අරමුදල කියන්නෙ. සේවක අර්ථසාධක අරමුදලත්, සේවක භාරකාර අරමුදලත් කියන අරමුදල් දෙකම ඒවායේ විශාලත්වය හේතුවෙන් විවිධ අවස්ථාවල කොල්ලකෑම් වලට ලක්වෙනවා. මේ වෙනකොට එනම් 2022 අවසන් වන විට සේවක අර්ථසාධක අරමුදලේ විශාලත්වය රුපියල් ට්‍රිලියන වලින් ගත්තොත් 3.7ක්. රුපියල් බිලියන 3700ක්. සේවක භාරකාර අරමුදල ගත්තොත් බිලියන 460 කට ආසන්න මුදලක්. මේ දෙකේම එකතු ගත්විට බිලියන 4300 කට ආසන්න මුදලක්.

මේ බිලියන 4000 කට වැඩි මේ අරමුදල්වලින් 98% ක්ම ණය අරගෙන තියෙන්නෙ ආණ්ඩුව. සේවක අර්ථ සාධක අරමුදල මහ බැංකුවේ මුදල් මණ්ඩලය යටතේ පාලනය වෙනවා. එහි අධිකාරිවරයෙක් යටතේ ආයෝජන කමිටුවක් විසින් තීරණ ගන්නවා. සේවක භාරකාර අරමුදලට භාරකාර මණ්ඩලයක් තියෙනවා. එය කම්කරු දෙපාර්තමේන්තුව යටතේ පාලනය වෙනවා. එය සභාපතිවරයෙක් සහ අධ්‍යක්ෂක මණ්ඩලයක්

> **මෙහිදී බලපෑමක් නොකළ යුතුම ආයතනයට තමයි ආණ්ඩුවේ මේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් බලපෑම සිදුවෙන්න සලස්වා තිබෙන්නේ. ඒ මගින් සේවකයින්ට විශාල පාඩුවක් වෙනවා. සේවක අර්ථසාධක අරමුදලින් ඔවුන්ට වර්ෂයකට පොලී හැටියට ලැබෙන්න තියෙන බිලියන 150කට ආසන්න මුදලක් කපාගන්න තමයි ආණ්ඩුව මේ සැලසුම හදන්නේ.**

යටතේ පාලනය වෙනවා. ඒ ආකාරයට තමයි මේ දෙක පාලනය වෙන්නෙ.

මේ අරමුදල හඳුන්වාදීමේ දීම, පනතේ තියෙනවා, මෙම අරමුදල ආයෝජනය කිරීමට අදාළ උපදෙස්. එහි කියලා තියෙනවා රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන්න. රජය මුදල් මණ්ඩලයේ යම් අවබෝධයක් යටතේ කොටස් වෙළඳපොලේ ආයෝජනය කළා 05% කට ආසන්න මුදලක්. හැබැයි ඒ 5% යම් වෙලාවල්වල වෙනස් වුණා. හේතුව මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මේ අගය 10%, 12% වගේ දක්වා වැඩි කරපු කාල තිබුණා. ඒ තමයි කොටස් වෙළඳපොලේ ඩීල් දාලා මේක කොල්ලකාපු කාලේ. 2008-2012 කාලේ සේවක අර්ථ සාධක අරමුදල කොටස් වෙළඳපොළේ දාලා කොල්ලකෑවා. 2008 - 2012 කොටස් වෙළඳපොළේ දාලා මේ අර්ථ සාධක අරමුදලට මුදල් කෝටි 3000කට වැඩිය අහිමි කළා. ඊට පස්සේ මේ අරමුදලට සිදුවුන හානිය තමයි 2015 බැඳුම්කර වංචාව. රනිල් වික්‍රමසිංහ, අර්ජුන මහේන්ද්‍රන් සහ එයාගේ බෑණත් එක්ක එකතුවෙලා කරපු මගඩියෙන් මිලියන 45,000ක් අරමුදලට පාඩු කළා. 2011 වර්ෂයේත් මේ විදිහටම මහින්ද රාජපක්ෂ මේ අරමුදලින් 1/3ක්ම අරගෙන විශ්‍රාම අරමුදලක් ගොඩනගනවා කියලා ගෙනාපු වැඩපිළිවෙළ සහ පනතත් පරාජය කරලා රාජපක්ෂ ආණ්ඩුව ගෙදර යවන්න වැඩ කළේ මේ රටේ ජනතාව.

***නියමුවා:- ආණ්ඩුවේ ණය ප්‍රශස්තකරණ වැඩපිළිවෙළ නිසා මෙම අරමුදල් සහ ඉන් වැඩකරන ජනතාවට ලැබිය හැකි ප්‍රතිලාභ අවදානමට ලක්වී තිබෙන්නේ කොහොමද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** දැන් ආණ්ඩුව දේශීය ණය සහ විදේශීය ණය ගෙවීමේ අර්බුදයකට මුහුණ දීලා තියෙනවා. මේ ණය අර්බුදයට උත්තරයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමග ආණ්ඩුව විදේශීය ණය ප්‍රතිව්‍යුහතකරණය කිරීමේදී දේශීය ණයත් ප්‍රතිව්‍යුහගතකරණය කරන්න එකඟ වෙලා තියෙනවා. ඒ එකඟතාවයෙදි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා දේශීයව අරන් තියෙන ණයවල පොලිය වැඩියි. ඒ කියන්නෙ ණය සේවාකරණය (debt service) වැඩියි. ඒක දැන් ගෙවන්න අමාරුයි. ඒ නිසා ණය සේවාකරණය වාර්ෂිකව දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.5% ක ප්‍රමාණයකින් අඩුකරගන්න කියල යෝජනා කරනවා. දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.5% ක ප්‍රමාණයක් වාර්ෂික අඩු කරගන්න නම් ණය සඳහා ගෙවන පොලිය තමයි අඩු කරගන්න ඕනේ. ණය සඳහා ගෙවන පොලිය අඩුකරනවා නම් ආණ්ඩුව දේශීයව අරන් තියෙන සමස්ත ණයවලින් තමයි මේක අඩුකරගන්න ඕනේ.

මෙම අරමුදල් ආයෝජනය කරල තියෙන්නෙ මේ රටේ ආණ්ඩුවේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ යෝජනාව මගින් දැන් ආණ්ඩුව දැන් කියනවා නව ප්‍රතිව්‍යුහගතකරණ බැඳුම්කරයක් නිකුත් කරනවා කියලා. නමුත් කාටද මේ නව බැඳුම්කර නිකුත් කරන්නෙ? ඉතාම පැහැදිලිව මෙම ප්‍රතිව්‍යුහගතකරණ බැඳුම්කරය නිකුත් කරන්න සූදානම් කරලා තියෙන්නේ සේවක අරමුදල්වලට පමණයි. විශ්‍රාම අරමුදල් (Superannuation Funds) ඉලක්ක කරගෙන තමයි මේ බැඳුම්කරය නිකුත් කරන්න හදන්නේ. එතකොට ආණ්ඩුව දේශීයව අරන් තියෙනවා ණය ට්‍රිලියන 16ක්. බිලියන 16,000 ක්. 1958 මෙම අරමුදල හදන්න කලින් තිබුණ සේවක අරමුදල් එක්ක රට ඇතුලෙ තියෙනවා සේවක අරමුදල් 117ක්. මේ 117න් ආණ්ඩුව අරන් තියෙන ණය ප්‍රමාණයක් තියෙනවා. ඒත් රටේ අරන් තියෙන සමස්ත ණය ප්‍රමාණය ගත්තම ඒ බිලියන 16,000න් 26% කට ආසන්න ණයක් තමයි මේ විශ්‍රාම අරමුදල්වලින් අරන් තියෙන්නෙ. ඉතුරු 74%ම අරන් තියෙන්නේ පෞද්ගලික අංශයෙන්. මහ ධනපතියන්ගෙන්, පෞද්ගලික අංශයේ බැංකුවලින්, රක්ෂණ සමාගම්වලින් ගත්ත ණය තියෙනවා. නමුත් ආණ්ඩුවේ මේ යෝජනාව මේ කාටවත් බලපාන්නේ නෑ. මේ විශ්‍රාම ගියාට පස්සේ විශ්‍රාම වයසට කීයක් හරි ඉතුරු කරගන්ත, එය විශ්‍රාම වැටුප ලෙස භාවිතා කරන්න බලපොරොත්තුවෙන් ඉන්න මිනිස්සුන්ගේ අරමුදලට තමයි මේ බලපෑම සිදුවෙන්නේ.

ඒ බලපෑම සිදුවෙන විදිහ ගැන කතාකළොත් මේ විශ්‍රාම අරමුදල්වලට ඒවායෙන් අරගත්ත ණය වෙනුවෙන්



**අන්තර් සේවක සංගමයේ සභාපති**
**වසන්ත සමරසිංහ සහෝදරයා**

නිකුත් කරපු බැඳුම්කරයක් තියෙනවා. උදාහරණයක් විදිහට ලොකු අරමුදල වෙන සේවක අර්ථසාධක අරමුදල ගමු. මේ අරමුදල 2045 වෙනකල් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කරලා තියෙනවා. 2023 සිට ගත්තොත් වාර්ෂිකව අවුරුදු 10, 15, 20, 25, 30 ආයෝජනය කරපු බැඳුම්කර තියෙනවා. 2023 සිට 2043 දක්වා අවුරුදු 20ට ආයෝජනය කරපු බැඳුම්කර තියෙනවා. දැන් මේවාට වාර්ෂිකව කූපන් අනුපාතයක් (coupon rate) අපිට ලැබෙනවා. කල්පිරීමේ අනුපාතයක් (maturiry rate) අපිට ලැබෙනවා. මේ බැඳුම්කර ආණ්ඩුව මුකුත් බලපෑමක් නොකර මේ මේ විදිහටම තිබුණොත් ආයෝජනය කරපු ආයෝජනවල කල්පිරීමේදී ලැබෙන පොලියත් වාර්ෂිකව ගෙවන්න එකඟ වෙන පොලියත් අපිට ලැබුණොත් තව අවුරුදු 15කදී දැන් බිලියන 3700ක තියෙන අරමුදල ට්‍රිලියන 16ක් වෙනවා. නමුත් ආණ්ඩුවේ මේ යෝජනාව මගින් මේ 2038 දී නැත්නම් අවුරුදු 15කින් ට්‍රිලියන 16ක් දක්වා වර්ධනය වෙන්න පුළුවන් අරමුදල ට්‍රිලියන 10කට සීමා වෙනවා. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණ යෝජනාව තියෙන්නේ 2038 වෙනකල් වසර 15ක්. ඒ වෙන්නෙ කොහොමද?

දැන් ඔවුන් අපට දීලා තියෙන ඔක්කොම බැඳුම්කර අලුත් කරන්න හදනවා. උදාහරණයක් විදිහට අපි හිතමු සේවක අර්ථසාධක අරමුදල 2030 කල්පිරෙන බැඳුම්කරයක ආයෝජනය කරල තියෙනවා. ඒකට ලැබෙන කූපන් අනුපාතය එක 12% යි, කල්පිරීමේ අනුපාතය 20% කියලා. අපි හිතමු පෞද්ගලික බැංකුවක්, රක්ෂණ සමාගමක්, සාමාන්‍ය පුද්ගලයෙක් සහ සේවක අර්ථසාධක අරමුදල ඒ බැඳුම්කරය අරගෙන තියෙනවා කියලා. දැන් අනිත් තුන්දෙනාටම නැතුව සේවක අරමුදලට විතරක් කියනවා 09%ට බැඳුම්කරයක් දෙනවා කියලා. මේක පැහැදිලිවම අසමාන සැලකීමක්. මේක තමයි මෙතන වෙන්නෙ. එතකොට මේ 26%ක් වන පිරිසට විතරක් 09% අනුපාතයට බැඳුම්කරයක් දෙනවා කියනවා. වෙන කාටවත් මේකෙන් බලපෑමක් වෙන්නේ නැහැ. මෙහිදී බලපෑමක් නොකළ යුතුම ආයතනයට තමයි ආණ්ඩුවේ මේ දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණයෙන් බලපෑම සිදුවෙන්න සලස්වා තිබෙන්නේ. ඒ මගින් සේවකයින්ට විශාල පාඩුවක් වෙනවා. සේවක අර්ථසාධක අරමුදලින් ඔවුන්ට වර්ෂයකට පොලී හැටියට ලැබෙන්න තියෙන බිලියන 150කට ආසන්න මුදලක් කපා ගන්න තමයි ආණ්ඩුව මේ සැලසුම හදන්නේ. ණය සේවාකරණයේදී 0.5%ක් දළ දේශීය නිෂ්පාදිතයෙන් කපා ගන්න ඕනෙ ප්‍රමාණය තමයි මේ ලැබෙන්න තියෙන පොලියෙන් කපා හරින්න හදන්නේ. සේවකයන්ට තමන්ට ලැබෙන්න තියෙන සල්ලි ටික මේකෙන් නැතිවෙනවා. උදාහරණයක් ගත්තොත් රුපියල් ලක්ෂ 10ක් තියෙන ගිණුමකට වසරකට රුපියල් ලක්ෂයකට වැඩි මුදලක් අහිමි වෙනවා. අවුරුදු 15 අවසන් වන විට ඒ තැනැත්තාට ලක්ෂ 15ක් අහිමි වෙනවා. ඔහුගේ ගිණුම ලක්ෂ 40ක් විමට නියමිත වුණත් එය ලක්ෂ 25න් නවතිනවා. දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය කියලා ගේන්න හදන වැඩපිළිවෙළ බරපතළ සේවක අරමුදල් කොල්ලයක්.

***නියමුවා:- අර්බුදය උත්සන්න වීමේ පීඩාවත් දැන් අර්බුදයෙන් ගොඩ ඒමට යැයි කියමින් ආණ්ඩුව ගන්නා ක්‍රියාමාර්ගවල පීඩාවත් ජනතාවටයි. මේ තත්වය යටතේ ජනතාවට ඇති විකල්පය කුමක්ද?***

***වසන්ත සමරසිංහ සහෝදරයා:-*** අපේ රට අනුගමනය කරමින් තිබෙන ආර්ථික ප්‍රතිපත්තිය ආර්ථික ක්‍රමවේදය නිසා තමයි අපි මේ අසාර්ථක වෙලා තියෙන්නෙ. එතකොට ඒ ආර්ථික ප්‍රතිපත්තිය අනුගමනය කරන ආර්ථික ඔස්තාර්ලා කියන මිනිස්සුම තමයි අපිට ආපහු මේ උත්තර හොයන්න හදන්නේ. ජනතාව අලුත් උත්තරයක් හොයන්න හදද්දි ජනතාවට ඒ උත්තරේ හොයා ගන්න ඉඩ නොතබා අද ප්‍රජාතන්ත්‍ර විරෝධිව මැතිවරණ කල් දාලා ජනතාවගේ ඡන්ද අයිතිය පවා කොල්ලකාලා තියෙනවා.

නමුත් අපි විශ්වාස කරනවා ජාතික ජන බලවේගය ලෙසත් මේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරය ලෙසත්, අලුත් සමාජ පරිවර්තනයක වුවමනාව සමාජය බලාපොරොත්තු වෙනවා කියලා. දැන් ජනතාව නව දේශපාලන පරිවර්තනයක් සඳහා සූදානම් වෙමින් තියෙන වෙලාවක්. ඒ නිසා උත්තරය නව දේශපාලන සංස්කෘතියක් සහිතව ගොඩනැගෙන නව දේශපාලන පරිවර්තනයක් සහිතව ගොඩනැගෙන නව පාලනයක්. මිනිස්සුන්ට විශ්වාසයෙන් ජීවත් වෙන්න පුළුවන් රටක් තියෙන්න ඕනෙ. ජනතාවත් එක්ක අපි ප්‍රජාතන්ත්‍රවාදිව ඒ බලය ගොඩනැගීම වෙනුවෙන් කටයුතු කරනවා. ජනතාවගේ ප්‍රශ්න විසඳන අලුත් ජනවරමක් සහිත ජනතාවාදී ආණ්ඩුවක් ගොඩනැගීම තමයි අපි විසඳුම විදිහට දකින්නේ. ඒ නිසා ජනතාව සමග අත්වැල් බැඳගත් ජාතික ජන බලවේගයේ ආණ්ඩුවක් ගොඩනැගීම තමයි මේකට තියෙන විසඳුම.

# බහු ධ්‍රැවීය ලෝකයකට සූදානම් වන අප්‍රිකාව




ලෝක දේශපාලන බල තුලනයේ නව සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් දෙවන 'රුසියානු-අප්‍රිකානු සමුළුව' පසුගිය ජූලි 28 වනදා රුසියාවේ සෙන්ට් පීටර්ස්බර්ග් නුවරදී අවසන් විය. ඒ සඳහා අප්‍රිකානු රටවල් 54න් රටවල් 49ක නියෝජිතයින් සහභාගි වූ අතර ඒ අතරින් 17 දෙනෙක් රාජ්‍ය නායකයෝය. සමුළුව අවසානයේදී ආරක්ෂාව, වෙළඳාම, බලශක්තිය හා දේශගුණික විපර්යාසවලට අදාළව පොදු ප්‍රකාශනයක්ද නිකුත් කෙරිණි. ආරම්භක රුසියානු අප්‍රිකානු සමුළුව පැවැත්වූයේ 2019 වසරේදී සෝචිවලදීය. එහිදී සෑම වසර තුනකටම වරක් මෙම සමුළුව පැවැත්වීමට යෝජනා වී තිබිණි.

මෙම සමුළුවේ ප්‍රධාන ප්‍රතිඵලවලින් එකක් වූයේ දේශපාලනය, ආරක්ෂාව, ආර්ථිකය, වෙළඳ හා ආයෝජන, කෘෂිකර්මය, බලශක්තිය, ප්‍රවාහනය, පරිසරය හා සංස්කෘතික වැනි ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සංවාදය හා සහයෝගීතාව ශක්තිමත් කිරීම සඳහා කරුණු 181කින් යුත් සැලැස්මක් 2023 - 2026 කාලය සඳහා අනුමත කර ගැනීමයි.

## රුසියාවෙන් ආහාර ආධාර

මෙවර රුසියානු අප්‍රිකානු සමුළුව පැවැත්වූයේ විශේෂ අවස්ථාවකදීය. එනම් යුක්‍රේනයේ සිට කළු මුහුද හරහා ධාන්‍ය අපනයනය කිරීමට අවසර දීමේ ගිවිසුම අවසන් වීමත් සමගය. 2022 වසරේදී ආරම්භ වූ රුසියානු යුක්රේන යුද්ධයත් සමග යුක්‍රේනයේ හා රුසියාවේ ධාන්‍ය ලෝක වෙළඳපොළට නිකුත් කිරීම ඇණ හිටියේය. යුක්‍රේනය හා රුසියාව යන දෙරටෙහි ධාන්‍ය නිෂ්පාදනය ලෝක ධාන්‍ය නිෂ්පාදනයෙන් සියයට 25කි. මේ නිසා ලෝකයේ අනෙකුත් රටවල් ආහාර හිඟයකට මුහුණ පෑමේ අනතුර මතුවිය. විශේෂයෙන් එහි වැඩිම අවදානම සහිත රටවල් වූයේ අප්‍රිකානු රටවල්ය. මෙම ගිවිසුම අත්සන් කරන ලද්දේ එකී ආහාර හිඟය වැළැක්වීමේ අදහසිනි.

මෙම සමුළුවේදී රුසියානු ජනාධිපති පුටින් ප්‍රකාශ කළේ යුක්‍රේනය අපනයනය කර ඇති ධාන්‍ය ටොන් මිලියන 32.8න් 70%ට වැඩි ප්‍රමාණයක් 'ඉහළ හා සාමාන්‍ය ආදායම්' ලබන රටවලට, මූලික වශයෙන් යුරෝපා සංගමයට අපනයන කරන ඇති බවත් ඉතියෝපියාව, සෝමාලියාව හා සූඩානය ඇතුළු රටවලට අපනයනය කර ඇත්තේ 03%ක් පමණ සුළු ප්‍රමාණයක් බවත්ය. මේ නිසා ඉදිරි මාස තුන හතර ඇතුළත බුර්කිනෝ ෆාසෝ, සිම්බාබ්වේ, මාලි, සෝමාලියාව, මධ්‍යම අප්‍රිකානු ජනරජය සහ එරිත්‍රියාව යන රටවලට ධාන්‍ය ටොන් 25,000 සිට 55,000ක් අතර ප්‍රමාණයක් නොමිලේ සැපයීමට සූදානම් බව පුටින් එහිදී නිවේදනය කළේය. තවදුරටත් ප්‍රකාශ කර සිටියේ රුසියාව අප්‍රිකානු රටවල් සඳහා ඩොලර් බිලියන 23ක ණය කපා හැර ඇති බවත් ණය සහන සඳහා අතිරේක ඩොලර් 90කට වැඩි මුදලක් ඉදිරියේදී වෙන් කිරීමට බලාපොරොත්තු වන බවත්ය.

## සවිමත් වන රුසියානු අප්‍රිකානු සම්බන්ධතා

මෙම සමුළුව පිළිබඳ අදහස් දක්වමින් දේශපාලන විචාරකයන් ප්‍රකාශ කළේ එය රුසියාව හා අප්‍රිකානු රටවල් අතර රාජ්‍යතාන්ත්‍රික සබඳතාවන්ගේ සන්ධිස්ථානයක් බවය. එය සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසු රුසියාව හා අප්‍රිකානු රටවල් අතර ඇතිවූ ශක්තිමත්ම බැඳීම ලෙස ඇතැම්හු සඳහන් කරති. එසේම එය අප්‍රිකාව හා රුසියාව අතර වෙළඳ සබඳතා ශක්තිමත් කිරීමටත් විශේෂයෙන් ස්වභාවික සම්පත් ක්ෂේත්‍රයේ සබඳතා ශක්තිමත් කිරීමටත් ඒ අනුව රුසියාවට උපායමාර්ග වැදගත්කමින් යුතු සමුළුවක් බවය. ඒ අනුව යටත්විජිතවාදයට එරෙහි සටන් පාඨය යටතේ අප්‍රිකාව තුළ දැනට පවතින බටහිර ආධිපත්‍යයට එරෙහි එකමුතුවක් ගොඩනැගීමේ තවත් එක් සන්ධිස්ථානයක් මෙම සමුළුව මගින් නිර්මාණය කර ඇති බව ඔවුන්ගේ අදහසයි.

තවද මෙම සමුළුව මගින් රුසියාව ලෝකයට දී ඇති අනෙක් පණිවුඩය වන්නේ බටහිර අධිරාජ්‍යවාදී රටවල් රුසියාව හුදෙකලා කිරීමට උත්සාහ කළද එසේ කළ නොහැකි බවය. විශේෂයෙන් මෙම සමුළුව සඳහා අප්‍රිකානු රටවල් 54න් 49කම නියෝජිතයින් සහභාගි වීමෙන් ඒ බව හොඳින් පෙන්නුම් කර තිබේ.

## බහුපාර්ශ්වීය ලෝකයක් කරා

බටහිර රටවල් යුක්‍රේන යුද්ධය පාවිච්චි කර ගනිමින් රුසියාව හුදකලා කිරීමට උත්සාහ කළද අප්‍රිකානු රටවල් මෙම සමුළුවට සහභාගි වීම මගින් ප්‍රකාශ කර ඇත්තේ ඔවුන් බටහිරට පක්ෂග්‍රාහී වීමට සූදානම් නැති බවය.

පසුගිය කාලය තුළදී අප්‍රිකාවේ ස්වභාවික සම්පත් සහ වෙළඳපොළ වෙනුවෙන් එක්සත් ජනපදය ප්‍රමුඛ කර ගනිමින් ප්‍රංශය ඇතුළු බටහිර අධිරාජ්‍යවාදී රටවල්ද අනෙක් පසින් චීනය රුසියාව ඇතුළු රටවල්ද මේ වන විට සිටින්නේ තරගයකය. කෙසේ වෙතත් පසුගිය කාලයේදී ලෝක ආර්ථිකය තුළ නව ලිබරල්වාදී ප්‍රතිපත්තියේ අසාර්ථකත්වයත් එහිම ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපදය හා යුරෝපය ආර්ථික වශයෙන් බිඳවැටීමත් විසින් ලෝක ආර්ථිකයේ නව තත්වයක් මතු කරනු ලැබ තිබේ. ඒ අනුව ලෝකයේ නව ආර්ථික ආකර්ෂණය වී ඇත්තේ බ්‍රික්ස් (BRICS) රටවල්ය. එය මෙතෙක් ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපා සංගමය විසින් පවත්වාගෙන ගිය ලෝක ආධිපත්‍යය අභියෝගයට ලක් කර තිබේ. මෙම සමුළුව විසින් පෙන්නුම් කරනු ලැබ ඇත්තේ බහුපාර්ශවික ලෝකයක් සඳහා වන ප්‍රවේශයට අප්‍රිකානු කලාපයද සූදානම් බවය.

එහෙත් ඒ අතරම අප තේරුම් ගත යුත්තේ මේ ගොඩනැගෙමින් තිබෙන්නේ අන්තර් අධිරාජ්‍ය ප්‍රතිවිරෝධය මත පදනම් වූ කේන්ද්‍ර ගත වීම් බවය.

## දකුණු අප්‍රිකාව: පුළුල් වන බ්‍රික්ස් සමුළුවට සත්කාරකත්වය දී




පහළොස්වන බ්‍රික්ස් සමුළුව අගෝස්තු 24 වන දින දකුණු අප්‍රිකාවේ ජොහැන්නස්බර්ග් නුවරදී අවසන් විය. එහිදී 'ජොහැන්නස්බර්ග් ප්‍රකාශය 11' එළිදැක්වුණු අතර ඉන් බහුපාර්ශ්වික ලෝකයක් වෙනුවෙන් පෙරට එන ලෙස ආයාචනයක්ද කර තිබේ.

තවත් එක් වැදගත් සිදුවීමක් වන්නේ සංවිධානයේ සාමාජිකත්වය පුළුල් කිරීමයි. ඒ අනුව අලුතින් සාමාජික රටවල් හයකට බ්‍රික්ස් සංවිධානයේ සාමාජිකත්වය පිරිනමන ලදී. ඒ අනුව ආජන්ටිනාව, ඊජිප්තුව, ඉතියෝපියාව, ඉරානය, සෞදි අරාබිය හා එක්සත් අරාබි එමීර් රාජ්‍යයට 2024 වසරේ ජනවාරි පළවෙනිදා සිට එහි සාමාජිකත්වය හිමි වනු ඇත. නව සාමාජික රටවල් සමඟින් බ්‍රික්ස් රටවල ආර්ථිකය ගෝලීය ආර්ථිකයෙන් 36%ක් වන අතර ගෝලීය ජනගහනයෙන් සියයට හතළිස් හතක් පමණ වේ.

## රුසියාව: වැග්නර් කුලී හමුදාව නායකත්වය අහිමිව



රුසියාවේ වැග්නර් කුලී හමුදාවේ ප්‍රධානියා වූ යෙව්ගෙනි ප්‍රිගොෂින් පසුගිය අගෝස්තු 23 වනදා රුසියාව තුළ සිදු වූ ගුවන් අනතුරකින් මරුමුවට පත් විය. එහිදී ඔහු සමගම යානයේ ගමන් ගත් වැග්නර් කුලී හමුදාවේ නිර්මාතෘ දිමිත්‍රි උට්කින්, එහි නියෝජ්‍ය ප්‍රධානියා වූ වැලරි චෙකලව්ද මරුමුවට පත්විය. මෙම කුලී හමුදාව රුසියාවේ වුවමනාවන් වෙනුවෙන් රටවල් ගණනාවකම යුද වැදුණු අතර යුක්‍රේන රුසියානු යුද්ධයේදීද රුසියාව වෙනුවෙන් සටන් වැදුණි. එහෙත් මෙම වසරේ ජුනි මාසයේදී බක්මුට් සටනින් මද කලකට පසුව රුසියානු රජයට හා හමුදාවට එරෙහිව වැග්නර් කණ්ඩායම කෙටිකාලීන කැරැල්ලක් ඇති කළේය. මෙම තත්වය ඔහුගේ මරණය ඉක්මන් කරවන්නට ඇති බවට විශ්වාස කෙරේ.

## ගුවතමාලාව: වාමාංශික ජනාධිපති අපේක්ෂකයාට ජය



අගෝස්තු විසි වන දින පැවති ගුවතමාලාවේ ජනාධිපතිවරණයේ දෙවන වටයේදී අධිරාජ්‍ය විරෝධී වාමාංශික අපේක්ෂක බර්නාඩෝ ඒරිවෙලෝ ලියෝන් ජයග්‍රහණය කළේය. ඔහු 58%ක ඡන්ද ප්‍රතිශතයක් ලබා ගත් අතර ඔහුගේ ප්‍රතිවාදී දක්ෂිණාංශික අපේක්ෂිකාවට ලබාගත හැකි වූයේ 38%ක ඡන්ද ප්‍රතිශතයක් පමණි.

ඔහු 2024 වසරේ ජනවාරි 14 වැනි දින දිවුරුම් දීමට නියමිතය. ඔහු 1954 වසරේදී එක්සත් ජනපදයේ අනුග්‍රහය ලත් කුමන්ත්‍රණයෙන් නෙරපා හරින ලද ජාකොබ් ආබෙන්ස්ගෙන් පසු ගුවතමාලාවේ බලයට පත් වූ වඩාත්ම ප්‍රගතිශීලී නායකයා ඔහු ලෙස සැලකේ.

## එක්සත් ජනපදය: මෝටර් රථ කම්කරුවන් වැඩවරන තීරණයක




සිය හාම්පුතුන් සමග සාකච්ඡා අසාර්ථක වුවහොත් සැප්තැම්බර් 14වැනි දින සිට වැඩවර්ජනයෙහි යෙදීමට එක්සත් ජනපදය ප්‍රධානතම මෝටර් රථ නිෂ්පාදන සමාගම්වල සේවකයෝ තීරණය කර සිටිති. එක්සත් ජනපදයේ විශාලතම මෝටර් රථ නිෂ්පාදන සමාගම් වන ජෙනරල් මෝටර්ස්, ස්ටෙලැන්ටිස් සහ ෆෝඩ් සමාගම්වල සේවකයන්ගෙන් 97%ක් ඒ සඳහා පැවති ඡන්ද විමසීමේදී වැඩවර්ජනයට පක්ෂපාතීව ඡන්ද ප්‍රකාශ කර තිබේ.

# බුද්ධි ගලනයට තල්ලුව දෙන ලංකාවේ බදු

වෘත්තිකයින් රට හැර යාම මේ දිනවල ජනප්‍රිය මාතෘකාවකි. නිදහස් අධ්‍යාපනයෙන් ඉගෙන ගෙන ඉහළ පඩි ලබන අය රටේ ඇති සම්පත් භුක්ති විඳ තව සැප සොයා රට යන බව විවේචන ඇසින් දකින සමහරුන්ගේ මතයකි. 2023 ජනවාරි සිට ආණ්ඩුව හඳුන්වාදී ඇති උපයන විට ගෙවීමේ (Payee Tax) බදු අනුපාත ඉහළ නිසා එය දරාගත නොහැකි වීම හෝ ජීවන වියදමට මුහුණ දී ගත නොහැකි වීම නිසා තමන් රට යන බව එසේ කරන උගතුන් හා වෘත්තිකයින් ඒ වැයම සාධාරණීකරණයට ගෙනෙන තර්කයයි. 'ලක්ෂ 05-06ක් පඩි ලබන අය බදු වැඩියෙන් ගෙව්වාම මොකද වෙන්නේ' කියා එතරම් වැටුප් නොලබන, බදු නොගෙවන අයද තර්ක කරනු ද දැකිය හැකිය.


කෙසේ වුවත් මේ වන විට ඉතා කෙටි කාලයක් තුළ, විශාල උගතුන්, වෘත්තිකයින් ප්‍රමාණයක් රට හැර ගොස් ඇති බව පැහැදිලිය. ඒ අතර වෛද්‍යවරුන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ගුරුවරුන්, හමුදා සේවයේ නිලධාරීන්, ඉංජිනේරුවරුන්, තාක්ෂණික සේවාවල ඉහළ නිලධාරීන්, බැංකු ඇතුළු මූල්‍ය ක්ෂේත්‍රවල නිලධාරීන් ප්‍රධාන වේ. ජාතික විශ්වවිද්‍යාල පද්ධතියේ පමණක් හරි අඩක්ම කථිකාචාර්යවරුන් පුරප්පාඩු වී ඇති බව පසුගියදා මාධ්‍යවලින් වාර්තා විය.

## වෘත්තිකයාගේ ඛේදවාචකය

උගතුන් රට හැර යන්නේ බදු ගෙවීමට ඇති නොහැකියාව නිසාම යැයි කීම එක්තරා දුරකට නිවැරදිම නොවේ. නමුත් ඔවුන්ට රට අත්හැර යාමට ඇති හේතු රැසක් අතර එය ප්‍රමුඛතම හේතුව නොවේ යැයි කිව නොහැකි බව ඒ ගැන අධ්‍යයනයක් කරන ඕනෑම කෙනෙකුට වැටහෙන සත්‍යයකි.

2019 දෙසැම්බර් වනතුරුම වෘත්තිකයින් බදු නොගෙවා පැහැර හැරීමක් සිදුකළ බවට වාර්තා නොවීය. වාර්තා පිට වාර්තා පළ වූයේ බදු නොගෙවා පැහැර හැරි වංචනික ව්‍යාපාරිකයින් හා දේශපාලකයින් මෙන්ම දේශපාලන ගජ මිතුරන් ගැනය. වැට් බදු වංචනිකයින් මහා බැංකු මංකොල්ලකරුවන්, අර්ථසාධක පිල්ලි ගැසූවන්, දේශපාලකයින් මිස වෘත්තිකයෝ නොවූහ. අනෙක් අතට ජනතාවට ජීවත්වීමට බැරි තරමට රට බංකොලොත් වුණේද වෘත්තිකයින් බදු නොගෙවූ හේතුවක් නිසා නොවේ.

2019 වන තුරු මාසික බදු නිදහස් සීමාව රුපියල් ලක්ෂයද, ඊට වඩා වැඩි වන රු.50,000/- වැටුප කාණ්ඩයට 4%, 8%, බැගින් උපරිමය 24% දක්වා පුද්ගල බදු ප්‍රතිශතයක් පැවැතියේය. 2020 අයවැය මගින් ලක්ෂයේ සීමාව ලක්ෂ 2 1/2 දක්වාද, 50,000 සීමාවද 250,000 සිට ඉහළට දැමීමෙන්ද බදු ගෙවීමේ නිදහසක් වෘත්තිකයින්ට ලැබුණි. ආර්ථික අර්බුදයන් පැවැති 2020-2022 දක්වා වෘත්තිකයින්ට එවැනි සහනයක් හිමි වුවද, 2023 ජනවාරි වැටුපේ සිට



බලපැවැත්වෙන පරිදි, උපයන විට බදු ගෙවීමේ පුද්ගල බදු ගෙවීම සීමාව 2019 පැවැති පළමු නිදහස් මට්ටම 100,000 දක්වාද, ඉතිරි 50,000 මට්ටම්වල නිදහස 6% සිට 36% දක්වාද ඉහළ මට්ටමට වැඩි කරනු ලැබීය. මෙම බදු සංශෝධනයේ බලපෑම වෘත්තිකයින්ට කෙසේ සිදු වූයේද යන්න උදාහරණයක් මගින් පහසුවෙන් තේරුම් ගත හැකිය. මාසයකට රුපියල් ලක්ෂ 03ක වැටුප ලබන බැංකු සේවකයෙකු සැලකිල්ලට ගත හොත්, 2019 සිට 2022 දක්වා ඔහු මාසයකට ගෙවා ඇත්තේ රු.6000ක පමණ බද්දකි. ඔහුගේ එම බදු ප්‍රමාණය 2023 ජනවාරි වැටුපේ සිට එකවරම බද්ද ගෙවීම රුපියල් 35,000ක් දක්වා කලින් ගෙවූ ප්‍රමාණය මෙන් 06 ගුණයකින් ඉහළ යන ලදී. රුපියල් ලක්ෂ 03ක මාසික වැටුප රු.1000 බැගින් දෛනික වැටුප් ලබන වතු කම්කරුවෙකුට සාපේක්ෂව දැවැන්ත ලෙස පෙනී ගියද ඔහුගේ ජීවන මට්ටම අනුව බැංකු සේවකයාට එය සාධාරණ නොවේ. ඔහුට ඒ අනුව ගලපා ගත් ජීවිතයක් ඇත. වෛද්‍යවරයාට, නීතිඥයාට, විශ්වවිද්‍යාල ආචාර්යවරයාට කාටත් මෙය එලෙසය. එකම ආයතනයක් තුළ වුවද, කළමනාකරුගේ සිට කම්කරුවා දක්වා ගලපා ගත් ජීවිත පැවැත්මක් ඇත. මාසයකට රු.1500ක් - 2000ක් පුද්ගල බද්දක් ගෙවන ලද අයෙකුට එකවරම එම ප්‍රමාණය රු.150,000ක් ලක්ෂ දෙකක් වූ විට එයට ගැලපීමට කොහෙත්ම හැකියාවක් ඇත්තේ නැත.

## බද්දේ වටපිටාව

බද්දක් අය කරන විට පළමුව සැලකිල්ලට ලක් කළ යුත්තේ බද්ද වදින අයට එම බද්ද ගෙවිය හැකිද යන්නයි. බදු සාධාරණ විය යුතු බවට මූලධර්මයක්ම ඇත්තේ ඒ නිසාය. ආණ්ඩුවට හිතුමතේ බදු ගැසිය නොහැකිය. 2023දී මෙම වෘත්තිකයින්ට 36%ක බද්දක් පැනවූ වටපිටාවේදී 2021 හා 2022 වසර දෙකේදීම වැටුප් දර්ශක අනුපාතය 133:100ක් ලෙස පැවැතියේය. එම වැටුප් දර්ශක අනුපාතය සැකසීමේ පදනම් වර්ෂය 2016 සේ සලකයි. එහි තේරුම 2016දී රු. 100ක් වූ වැටුප් 2022දී 133ක් යන්නයි. නැතහොත් 2016 සිට වැටුප් වැඩිවී ඇත්තේ 2016 වැටුපෙන් 1/3ක් පමණි. 2021 හා 2022 දී කිසිදු වැටුප් වැඩිවීමක් සිදුවී නැත. නමුත් එසේ තිබියෙදී වැටුප් පමණක් සැලකිල්ලට ලක් කළද 36%ක් බදු වැඩි වූ විට ඒ පුද්ගලයා දරා ගනු ඇත්තේ කෙසේද?

මීට අමතරව වැටුප් වැඩි නොවුණු වටපිටාවක, උද්ධමනය දරාගත නොහැකි ලෙස ඉහළ ගිය බව අපි අමතක නොකළ යුතුය. ඒ නිසා බඩු මිල දෙතුන් ගුණයකින් ඉහළ ගියේය. එයින් වැටුපේ මූර්ත හැකියාව පහළ වැටුණි. ලක්ෂ 03ක වැටුපේ සැබෑ වටිනාකම 150,000කට පමණ අඩු විය. ඒ අඩු වූ මිලදී ගැනීමේ හැකියාව සහිත (වැටුපේ මූර්ත අගයට) සලකා හයගුණයක බදු වැඩි කළ විට වෘත්තිකයාගේ ජීවන පැවැත්ම කෙසේ කඩා වැටේදැයි ඔබට සිතා ගත හැකිය.

## "පොහොසත් බදු" දුප්පතාට!

සල්ලි තිබෙන පොහොසත් කෙනාට බදු වැදුණාට අපට කමක් නැතැයි දුප්පත් කෙනෙකුට හිතෙන්නට හැකිය. නමුත් පොහොසත් කෙනාට පැනවෙන පුද්ගල බදු දුප්පත් කෙනාටද, බදු නොගෙවන කෙනාගේ ජීවිත පැවැත්මටද සෘජු බලපෑමක් සිදු කරයි. රට හැර නොයා ජීවත්වීමට තම බදු කැපී මාසික වැටුප අතට පත්වන වෘත්තිකයා රු.150,000ක් සඳහා එක්කෝ අමතර ඉපයීමක් සොයා ගත යුතුය. නැතිනම්, වියදම පාලනයක් කරගත යුතුය. ඔහු කලින් වාහන සෝදන තැනකින් තමන්ගේ කාරය සෝදා ගත්තේ නම් දැන් ඔහු එය තනිව තමන් අතින්ම සිදුකර ගැනීමට පෙළඹේ. මිදුලේ තණකොළ කපා ගැනීමට කම්කරුවෙකු යොදා ගත්තේ නම්, දැන් සති අන්තයේ ගමන් අඩුකර ඔහුම එම කටයුත්තේ යෙදෙයි. කම්කරුවාට ගෙවන වැටුප් වෘත්තිකයා ඉතිරි කරගන්නේ එලෙසය. මේ ආකාරයට අවිධිමත් රැකියා ජාලයකටම මෙම ආදායම අහිමි වීමේ අර්බුදයක් ඇතිවීම වැළැක්විය නොහැකිය. වෘත්තිකයින් අපේක්ෂාභංගත්වය නිසා හෝ ජීවන මට්ටමට ගැලපීමට නොහැකි වීම නිසා රට හැර යාමෙන් ඒ ඒ වෘත්තීන්ට පමණක් නොව රැකියා ජාලයකටම බලපෑම් සිදුවේ. වෙනදා සති අන්තයේ ගමන් බිමන් ගිය, හෝටලයකට ගොස් ආහාර ගත් බොහෝ මැද පාංතික ජීවිත අද වියදම් පාලනයේ ප්‍රතිඵල නිසා දුප්පතුන්ගේ මට්ටම තවත් දුප්පත් කර හමාරය. අනෙක් අතට වැඩිපුර ක්‍රෙඩිට් කාඩ් හා ලිසිං පහසුකම් නිවාස ණය ගැනීම, මූල්‍ය වෙළඳපොළ, කුඩා ආයෝජන වැනි දේවල නිරත වූ වැඩි පිරිසක්ද මෙම වෘත්තිකයින්ය. දැන් දරාගත නොහැකි බදු බර නිසා ඔවුන්ගේ ණය ගෙවීමට ඇති හැකියාව අඩුවී ඇත. මූල්‍ය හා බැංකු පද්ධතිය බිඳ වැටීමේ අවදානමේ එකම හේතුව වෘත්තිකයින් නොවුණද ඔවුන්ට පනවා ඇති දරාගත නොහැකි බදු මීට සැලකිය යුතු බලපෑමක් කර ඇත.

> උද්ධමනය නිසා බඩු මිල දිනපතා ඉහළ යාම රටක තවදුරටත් තමන්ට විදේශ රටකට යාමට ඉඩ ඉල්ලුම තිබියෙදී තමන් වෙනුවෙන් හෝ රට වෙනුවෙන් හෝ මේ රට තුළ රැඳිය යුතු යැයි සිතීමට උගතුන්ට බුද්ධිමතුන්ට මේ දුෂ්ට පාලකයින් විසින් ඉඩක් ඉතිරි කර නැත.

## 'බදු' පොදු බලපෑම

රටකට බදු අවශ්‍ය වන ප්‍රධාන සාධක කිහිපයකි. ආර්ථිකයේ දිශානතිය තීරණයට, ආදායම බෙදීයාමේ විෂමතා අඩු කිරීමට හා ආදායම් දිශානතිය තීරණයට, ඉතිරි කිරීම ප්‍රවර්ධනයට හෝ අඩු කිරීමට, ප්‍රාග්ධන වියදම සඳහා යෙදවීම බදු මගින් කළ හැකිය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ යෝජනා අනුව හෝ ආණ්ඩුවේම තනි තීරණ අනුව හෝ මෑතකදී ලංකාවේ රාජපක්ෂ-වික්‍රමසිංහ හවුල විසින් සිදුකළ බදු සංශෝධනය මගින් සිදුකර ඇත්තේ තම, ජනතාව කබලෙන් පිටතට ඇද දමා තනි කිරීමයි. කලින්, 08% ට පැවැති වැට් (VAT) බද්ද 15% ක් කරන ලදී. (දැනට යෝජනා වී ඇත්තේ එය ඉදිරියේදී 24% ක් දක්වා වැඩි කිරීමටය) 06% - 12% මට්ටමේ පැවැති ආදයම් බද්ද 36%ක් කරන ලදී. ඊට අමතරව 2.5%ක නව සමාජ ආරක්ෂණ බද්දක්ද හඳුන්වා දෙන ලදී. 600%ක පමණ වැඩි වන පරිදි පුද්ගලයින් මත සෘජුව බදු පනවා 2048 වසරේදී අපි ආර්ථිකය හදන්නේ යැයි කියන පාලකයන් එවා වර්තමානයට කෙසේ බලපානු ඇති දැයි කල්පනා කර නැත.

## බුද්ධි ගලනයට තල්ලුව

රටට සෘජු විදේශ ආයෝජනද නොපැමිණෙන වටපිටාවක යෙදවුම් (ඉන්ධන, විදුලිය, පොහොර වැනි) මිල ගණන් අධිකව පවතිද්දී, උද්ධමනය නිසා බඩු මිල දිනපතා ඉහළ යාම රටක තවදුරටත් තමන්ට විදේශ රටකට යාමට ඉඩ ඉල්ලුම තිබියෙදී තමන් වෙනුවෙන් හෝ රට වෙනුවෙන් හෝ මේ රට තුළ රැඳිය යුතු යැයි සිතීමට උගතුන්ට බුද්ධිමතුන්ට මේ දුෂ්ට පාලකයින් විසින් ඉඩක් ඉතිරි කර නැත.


උගතුන් බුද්ධිමතුන් රට හැර යන්නේ යැයි හඬා වැටී පලක් නැත. සමහරුන් තර්ක කරන්නේ, ලංකාව හැර යන උගතුන්ට ලංකාවේදී ගෙවන්නට සිදුවී ඇති 36%ට වඩා ඇමෙරිකාවේදී කැනඩාවේදී, ඕස්ට්‍රේලියාවේදී, එංගලන්තයෙදී බදු ගෙවන්නට සිදුවන බවය. එහි සත්‍ය කොටසක් ඇත්තේය. ඒ, එම රටවල බදු ප්‍රතිශතය ඉහළ බවයි. නමුත්, ඉහළ බදු ප්‍රතිශතය අය කරන්නේ ලංකාවේ තරම් ගලපාගත නොහැකි වැටුප් ලබන අයගෙන් නොවේ. වෘත්තිකයින් සැලකුවද එංගලන්තයේ 45%ක් පුද්ගල බදු අය කරන්නේ මාසයක පවුම් 10,000ක

11 වැනි පිටුවට



"සුළු පිරිසක් විසින් බලය අල්ලා ගැනීමක් වෙනුවෙන් අපි පෙනී නොසිටිමු. අපි මාක්ස්වාදීන් වෙමු. අප පෙනී සිටින්නේ, සුළු ධනපති මත් ගතියට විරුද්ධවද ජාත්‍යෝන්මාදවාදයට, ආරක්ෂාවාදයට, වදන් හරඹයට හා ධනපති පංතිය කෙරෙන් යැපීමට විරුද්ධවද, නිර්ධන පංතියේ පංති අරගලයට පක්ෂවද වේ."

**ලෙනින්**
**තෝරාගත් කෘති, 05වැනි වෙළුම, 32 පිටුව**



# තේ කහට තද රතුයි!

"ලංකාව ස්වර්ග භූමියක්. එහේ කෝපි ගස්වල කිතුල් හකුරු හටගන්නවා. එහේ හැදෙන තේ පඳුරුවල මුල් උදුරලා වේලලා ගත්තම තමයි මේ රසවත් උම්බලකඩ ලැබෙන්නේ. එහේ තේ කුඩුවල රත්තරන් තියෙනවා..."

වතුවලට කුලීකරුවන් ගෙනයාම රැකියාව කරගත් කංකානිවරුන්ගේ මෙවන් ප්‍රයෝග හමුවේ රැවටී වතු කම්කරුවන් ලෙස 1823 දී කෝපි වගාව සඳහා තලෙයිමන්නාරම, ආදම්ගේ පාලම හා කොලොම්තොට හරහා ඔවුහු ලංකාවට පැමිණියහ. ඒ පළමු මොහොතේම රැවටීමට ලක් වෙමිනි.

පැමිණි දා පටන් වතු හිමියන්ට රිසි පරිදි ලබාදුන් ඉතා අඩු දෛනික වැටුප වෙනුවට රුපියල් 1000ක වැටුප් ඉල්ලීම කරළි ගතවෙමින් ගොස් අද දවසේ එය දිනකට තේ දලු කිලෝ 20ක් සඳහා රුපියල් දහසක් ගෙවීමට යෝජනා වී තිබේ. නමුත් දලු කිලෝ 20ක් දිනපතා නෙළීම දුෂ්කරය. 20ට වඩා කිලෝවක් අඩු වුණත් රුපියල් දහස ගෙවන්නට වතු හිමියන් සූදානම් නැත.

වතු කම්කරු ජනතාව යනු රටේ ආදායමෙන් වැඩි පංගුවකට දායකත්වය ලබාදෙන පිරිසයි. ඔවුන්ගෙන් වැඩි පිරිසක් කම්කරු කාන්තාවන්ය. නමුත් ඔවුන්ට උරුම වී ඇති ජීවිතය රටේ අනෙකුත් සාමාන්‍ය ජනතාවටත් එහා ගිය අන්ත දුːක්ඛිත එකකි. ඔවුන්ගේ ප්‍රධාන ආහාරවේල් සැකසෙන්නේ පාන් පිටි ආශ්‍රිතවය. පාන් පිටි කිලෝවක් රුː250/-කට වඩා වැඩිවන අතර පොල් ගෙඩියක් රුපියල් 100/-ක් 140/-ක් අතර වෙයි. හාල් කිලෝව රුපියල් 200/-ක් පමණ වන අතර අනෙකුත් ආහාර අවශ්‍යතා සඳහා දැරිය යුතු මිල ද ඉතා ඉහළය. ඒ අනුව කය වෙහෙසා වැඩකරන වතු ජනතාවට හරිහමන් පෝෂ්‍යදායී ආහාරවේලක් නොලැබේ.

එසේම අනෙකුත් මූලික අවශ්‍යතා සපුරා ගැනීම වෙනුවෙන් වන වියදම් ඔවුන්ට දැරිය හැකි සීමාවක නැත. තවමත් ඔවුන් ජීවත් වන්නේ ඉතා කුඩා ඉඩකඩක් සහිත ලැයිම් කාමරවල වන අතර දරුවන්ට අධ්‍යාපනය ලබා ගැනීමට හා දැනුම පෝෂණය කර ගැනීමට කිසිදු වැඩපිළිවෙළක් සකස් වී නැත. පසු කලෙක වතු ආශ්‍රිතව ඇති කළ පාසල් තුළින් මූලික අධ්‍යාපනය ලබන වතු දරුවන්ට වැඩිදුර අධ්‍යාපනය සඳහා නගරයේ පාසලකට යාමට සිදුවිය. නමුත් මාසිකව ලැබෙන සොච්චම කුසගින්න නිවා ගැනීමටවත් ප්‍රමාණවත් නොවෙන තත්ත්වයක් මත අධ්‍යාපනය යනු ඔවුන්ට තවත් එක් සිහිනයක්ම පමණකි.

එදා බ්‍රිතාන්‍ය ජාතිකයන් යටතේ වතුවලට බැඳ දැමුණු වහල් ජීවිතය වර්තමානයේදී අංශු මාත්‍රයක් හෝ වෙනස් වී නොමැත. අදත් දේශපාලකයනගේ හා දේශපාලනයේ ආනුභාවයෙන් ක්‍රියාත්මක වන වතු වෘත්තිය සමිති මෙම කම්කරු ජීවිත සමග සෙල්ලම් කරමින් හිඳියි.

වතු හිමියන් එසේ සූරාකෑමට ලක් කරද්දී කංකානිවරුන්ගේ බලපෑමට යටත් වීමටද වතු කම්කරු කාන්තාවන්ට සිදුවේ. එක් අතෙකින් ඔවුන්ට ණය ලබාදීමද, කඩවල්වලින් භාණ්ඩ ණයට දීමද කංකානිලා හරහා සිදුවේ. ඒ අනුව කංකානිගේ අතේ නැටවෙන රූකඩයක් බවට පත්වීමට ඔවුන්ට සිදුවේ. ඒ අතරම ලිංගික සූරා කෑමට ලක්වීමට ද වතු කම්කරු කාන්තාවන්ට සිදුවන්නේ තම බඩ වියත රැකදෙන රැකියාව බේරා ගැනීම වෙනුවෙනි. එසේ නොවුණ අවස්ථාවල රැකියාව අහිමි වීම, තරාදියේ දලු හොරට කිරීම, ණය ඉල්ලා බලපෑම් කිරීම වැනි බොහෝ කරදර විඳින්නට ඇයට සිදුවීම සුලබය.

අනෙක් දුːක්ඛිතම කාරණය වන්නේ එදා මෙන්ම තවමත් කුකුල් කූඩුවක් වැනි ලැයිම් කාමරවල ඔවුන්ගේ ජීවිත ගාල් වී තිබීමයි. හරි හැටි පිළිසකර නොකළ වහලවල්වලින් වැසි කාලයට වතුර දෝර ගලයි. නාය යෑම් වන විට ලැයිම් පිටින් ඒවාට හසුවෙන්නේ ඔවුන්ට උයා පිහාගත් වළං කෑලි කිහිපය ද අහිමි කරමිනි.

හරිහැටි වැසිකිළි පහසුකම් හෝ නොමැති තත්වයක් තුළ වතු කම්කරු කාන්තාවන් දැඩි අසීරුතාවයකට පත්වෙන අතර, දරුවන් නිරන්තර ලෙඩ රෝගවලට ලක්වීමද දක්නට ලැබේ. වත්තෙන් මිදී වෙනත් ජීවිතයක් ගැන සිතන්නට පවා නොහැකි වන ලෙස ඔවුන් කඳුකරයේ සිරකරුවන් බවට පත්වී ඇත.පොදු සමාජයේ වතුකරය සම්බන්ධයෙන් ආකල්පය වී ඇත්තේ ගෙදර දොර වැඩ කටයුතු කර ගැනීමට,ළමුන් බලා ගැනීමට කුඩා ගැහැණු දරුවෙකු හෝ කාන්තාවක් සොයා ගත හැකි ස්ථානයක් ලෙසයි.

කෙසේ වෙතත් තේ වත්තට බැඳදමා ඇති මේ කම්කරුවන්ට ලැයිමෙන් එහා ජීවිතයක ඇති බව අවබෝධ කර දිය යුතුය. "වතු කම්කරුවෝද මනුෂ්‍යයෝ ය" යනුවෙන් සිතා කටයුතු කරන පාලනයක් වෙනුවෙන් ඔවුහුද එක මිටකට පෙළ ගැස්විය යුතුව තිබේ.

එසේ නොවුනහොත් එදා මෙන් අදත් හෙටත් ඔවුන් ලැයිම් කාමර තුළ පොල් නැති රොටියකින් හා කහට උගුරකින් කුස සනසා, කෝපි ගස්වලින් කිතුල් හකුරු නෙළන්නටත් තේ මුල්වලින් උම්බලකඩ ලබාගන්නටත් බලාපොරොත්තුවෙන් හිඳිනු ඇත.

## 200ක කතාව

තබා බැරි බර හිස මත
වරා සිනහව රැඳි වත
නෙළූ මුත් ජීවිතය පැසකට
ඉරා දැමුණේ ම හදවත

එදා සිට රැවටුණු හිත
හදා ගෙන, හඬන හදවත
සැගවුවත් දුක හනිකට
කිඳා බැස ඇත කඳුයාය මත

පයින් ඇවිදින කඳුවල
ලැයිම් අඳුරුය සදහට
හිල් වුණ වහල ඉහළින්
තවිතිසාවත් එබෙයි ඉඳහිට

සොරාගෙන ලේ කඳුළු දහඩිය
උරාගෙන හොඳම සාරය
ඉවත ලූ තේ රොඩු ගාණට
දිරාපත් වීය මේ ජීවිත

වේලෙනා කුහුඹු ජීවිත
පේවෙලා ඇවිත් කඳු සිඹින අරුණට
දෑත් දෙස බැලුවොතින් දකීවි
තේ කහට තද රතුය හැමවිට

මේ වෙන කොට වතු ජනතාව ඇවිල්ලා අවුරුදු 200කට වැඩිය ගතවෙලා. ඒත් ඔවුනට කන්නට හරිහමන් කෑමක් නැහැ.ඉන්න හොඳ ගෙයක් නැහැ. දරුවන් පාසල් යවන්නෙත් බොහොම අමාරුවෙන්. එපමණක් නොවෙයි හරියට රෝහලක් නැහැ. වෛද්‍යවරුනුත් නැහැ. ලංකාවේ ජාතික ආදායමෙන් වැඩි පංගුවක් උපයා දෙන මේ මිනිසුන්ගේ ජීවිතය ඔහොමයි. ලංකාවේ අනෙත් පෙදෙස්වල මිනිස්සු එක පාරක් රැවටෙද්දී, වතු කම්කරුවන් දෙපාරක් රැවටෙනා මිනිස්සු බවට පත්වෙලා. එයිනුත් වතුයායේ ජීවත් වන කාන්තාව හැම පැත්තකින්ම රැවටෙනවා. රටේ පාලකයාගේ සිට වත්තේ කංකානම දක්වා කාන්තාවන් යටත් පහත් කර ගනිමින් වහලියන් විදිහට වැඩ ගන්නවා. ඒ නිසා එම කාන්තාවන්ට අපි ආරාධනා කරනවා අපි හැමෝටම මිනිස්සු විදිහට ජීවත් වෙන්න පුළුවන් රටක් හදා ගන්න, අපත් සමග වෙන්න කියලා.



**ක්‍රිෂ්ණන් කලෛචෙල්වි**
**නුවරඑළිය දිස්ත්‍රික්කය**
**අයිතීන් උදෙසා කාන්තාවෝ සංවිධානය**

## "මිනිස්සු විදියට ජීවත්වෙන්න, අපත් සමඟ එක්වන්න!

## අප්‍රිකානු කලාපයේ කාන්තා සමුළුවක්!

ඈත දෙසින්

පසුගියදා කාන්තා සහ ළමා අයිතිවාසිකම් සහ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන පිහිටුවා ඇති රාජ්‍ය නොවන ජාත්‍යන්තර සංවිධානයක් වන **FIDA** හි අප්‍රිකානු කලාපීය සමුළුව 'මපුටෝ ප්‍රඥප්තිය සහ අප්‍රිකානු කාන්තාවː ඩිජිටල් තාක්ෂණය ක්‍රියාමාර්ග වේගවත් කිරීමේ අත්‍යවශ්‍ය සාධකයක් ලෙස' යන තේමාව යටතේ පවත්වන ලදි. මපුටෝ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වන්නේ අප්‍රිකාන් කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් එළඹ ඇති සම්මුතියයි.

මෙම සමුළුවේදී දැක්වූ අදහස් අතර අප්‍රිකානු කලාපයේ කාන්තා හිංසනය තුරන් කිරීමටත්, සමානාත්මතාවය ඇති කිරීමටත් කලාපයේ ආණ්ඩු සහ සියලු වගකිවයුතු පාර්ශවයන් විසින් මැදිහත් වී කටයුතු කල යුතු බවත් ඒ සඳහා නවීන තාක්ෂණය යොදාගැනීමට උත්සුක විය යුතු බවටත් පෙන්වා දෙන ලදි. තවද මපුටෝ ප්‍රඥප්තියේ සහ ජාත්‍යන්තර මානව හිමිකම් සම්මුතීන් අප්‍රිකානු රාජ්‍යයන් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කළ යුතු බවද පෙන්වා දෙන ලදී.

## අහිමි කළ නිදහස!




සිය අධ්‍යපන කටයුතු වෙනුවෙන් තලෙයිබාන් පාලනයෙන් පලාගොස් එක්සත් ජනපදයේ රැඳී අධ්‍යාපන කටයුතු කරන ඉංජිනේරු ශිෂ්‍යාවක් වන සොමායා ෆාරුකී **# AfghanGirlsVoices** යනුවෙන් ප්‍රචාරණ ව්‍යාපාරයක් ආරම්භ කර තිබේ. මෙහි ප්‍රධාන අරමුණ වී ඇත්තේ ඇෆ්ගන් කාන්තාවන්ගේ අධ්‍යාපන අයිතිය සම්සම්බන්ධයෙන් ගෝලීය අවධානය යොමු කිරීමයි. එසේම ඇෆ්ගනිස්ථානය අත්විඳින බේදවාචකය ලෝකවාසී ජනතාවට අමතක වීම වැළැක්වීමයි. තලෙයිබාන් පාලනයෙන් පලාගොස් තම අධ්‍යාපන අයිතිය හා ස්වාධීන ජීවිතය ළඟා කරගැනීමට අතලොස්සක් කාන්තාවන් හැකි වුවද අති බහුතරයක් කාන්තාවන් එම පාලනයට හුරුවෙමින් සිටී. කෙසේ නමුත් මර්දනය නොතකා විරෝධතාවයේ යෙදෙන කාන්තාවන් ද ඇෆ්ගනිස්තානය තුළ සිටින අතර ඔවුන් ලොවට පෙන්වන්නේ තවමත් ඇෆ්ගන් කාන්තාවන් තුළ ඇති ප්‍රගතිශීලීත්වය සහ ශක්තියයි.

## ඊශ්‍රායල් කාන්තාවෝ වීදි බසිති!

ඊශ්‍රයලයේ කාන්තා අයිතිවාසිකම් ක්‍රියාකාරිනියන් ඇතුළු දහස් ගණනක් බ්නෙයි බ්‍රාක් නගරයේදී වීදී බැස්සේ එරට දේශපාලනය සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියෙන් කාන්තාව පිටත තබා තිබීම සම්බන්ධයෙන් සහ කාන්තාවන්ට සිදුවන හිංසනය සම්බන්ධයෙන් විරෝධතාව පළකිරීම සඳහායි. විරෝධතා දක්වන කාන්තාවන් චෝදනා කරන්නේ එරට හරෙදි නායකත්වය සමග එකතුවී ආණ්ඩුව කාන්තාවට ඇති නිදහස සහ සමානාත්මතාවට අවම කිරිමට කටයුතු කරමින් සිටින බවයි. හරෙදි යනු යුදෙව් ඕතොඩොක්ස් ආගමික නිකායක් වන අතර ආගමික නීතිවලින් දැඩි ලෙස බැඳී සිටින කණ්ඩායමකි. මෙම ප්‍රජාවන් තුළ සාමාන්‍ය සිවිල් සමාජයේ කාන්තාවන්ට වඩා දැඩි සමාජ රෙගුලාසි වෙයි. එබැවින් මෙම විරෝධතාවය එම කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමක් ලෙසද විරෝධතාකරුවන් සලකයි. මෙම විරෝධතාව සංවිධානය කර තිබූ නගරය හරෙදි ප්‍රජාව වැඩි වශයෙන් ජීවත් වන නගරයක් වීමද විශේෂත්වයකි.

# විද්‍යාවේ ජයග්‍රහණ කාටද?

ඉන්දියාවේ අභ්‍යවකාශ වැඩසටහනට නව ජයග්‍රහණයක් එකතු කරමින් ඉන්දියාව විසින් අභ්‍යවකාශයට යවන ලද 'චන්ද්‍රයාන් 3' යානය සාර්ථක ලෙස පසුගිය අගෝස්තු 23දා සඳ මතට ගොඩ බැස්සවූ බව ලොව පුරා ජන මාධ්‍ය විසින් වාර්තා කර තිබුණි. ඒ අනුව සඳ මතුපිටට යානයක් ගොඩ බැස්සවූ 04වැනි රාජ්‍යය බවට ඉන්දියාව පත්විය. මීට පෙර මෙම කාර්යය කර තිබුණේ සෝවියට් දේශය, එක්සත් ජනපදය සහ චීනය පමණි. දැන් ඉන්දියාවද 'සඳ තරණය කළ' රටවල් අතරට පැමිණ තිබේ.

### විද්‍යාවේ ජයග්‍රහණයක් ලෙස...

ඉන්දියාව වැනි රටක් සාර්ථක ලෙස සඳ මතුපිටට යානයක් ගොඩබැස්සවීම සැබැවින්ම ඉන්දියාවේ මෙන්ම විද්‍යාවේද ජයග්‍රහණයකි. එය අගය කළ යුතු සතුටු විය යුතු කාර්යයකි. ආසියානු රටවල් අතර වැඩියෙන්ම මිත්‍යාවේ ගිලුණු ජනතාවක් ජීවත්වන්නේ ඉන්දියාවේය. අතීතයේ පමණක් නොව මෑතක් වන තුරුම ඉන්දියාවද ඇතුළු ආසියානු රටවල බොහෝ ජනතාවක් සඳ දෙවියෙක් ලෙස සැලකූහ. සඳට වැඳුම් පිදුම් කළෝය. මිනිසුන්ගේ ජීවිතවලට බලපෑම් කරන ග්‍රහයෙක් ලෙසද සඳට සැලකීය. සඳට වැඳුම් පිදුම් කරන ජනතාවක් සිටි රටක් සඳ ජයගැනීම අතිශයෙන් වැදගත් සිදුවීමකි. විද්‍යාවට, මානව දැනුමට, කෙතරම් හපන්කම් කළ හැකිද යන්න නැවත වතාවක් මේ මගින් ඔප්පු කර තිබේ.

අපේ පෘථිවිය තුළ මුලින්ම අභ්‍යවකාශය ජයගත්තේ සෝවියට් දේශය විසිනි. අභ්‍යවකාශයට ගිය පළමු මිනිසා සෝවියට් පුරවැසියෙක් වූ යූරි ගගාරින්ය. අභ්‍යවකාශයට ගිය පළමු කාන්තාවද සෝවියට් පුරවැසියෙකි. ඇය වැලන්ටිනා තෙරෙස්කෝවාය. සෝවියට් දේශය සඳ මතුපිටට යානා යැවීය. ඒ අතර සඳ මතට පා තැබීමේ ගෞරවය අත්කර ගත්තේ එක්සත් ජනපදයය. මේවා සිදුවූයේ 1960, 70 දශකවලය. ඒ අනුව අභ්‍යවකාශය ගවේශණය සාර්ථකවී අඩ සියවසකටත් වැඩි කාලයක් ගතවී තිබේ.

### විද්‍යවේ ජයග්‍රහණ හා ජනයාගේ ඉරණම

විද්‍යාව මෙතරම් ජයග්‍රහණයක් අත්පත්කර ගත්තද මිහිමත ජීවත්වන සාතිශය බහුතරයක් ජනතාව තවම ඉතා දුක්ඛිත ජීවිත ගත කරති. සුව කළ හැකි රෝග නිසා, ඖෂධ නැතිකම නිසා ලොව පුරා දිනකට මිය යන දරුවන් සංඛ්‍යාව 22,000කට වැඩිය. විද්‍යාව මෙතරම් දියුණු වී තිබියෙදීත් කුසගින්න නිසා දෛනිකව මිය යන ජනතාව 25,000ක් පමණ බවට වාර්තා වී තිබුණි.

නිවාස නැති, පානීය ජල පහසුකම් නැති, රැකියාවක් නැති ජනගහනය ඉතා විශාලය. අධ්‍යාපනය නොලැබෙන දරුවන් ගණනද විශාලය. මෙය මෙසේ වන්නේ ඇයි?

වත්මන් අසාධාරණ සමාජ ක්‍රමය තුළ විද්‍යාවේ, තාක්ෂණයේ ජයග්‍රහණවල ප්‍රතිඵල පොදු ජනයා වෙත ගලා යන්නේ නැත. ලාභය මත පදනම් වූ, ප්‍රාග්ධනය හිමි හා අහිමි ලෙස බෙදුණු, ප්‍රාග්ධනය හිමි පංතියේ පාලනයක් පවතින සමාජයක විද්‍යාවේ ජයග්‍රහණවලින් ඵල ලබන්නේ බලය හිමි අධිපති පංතියය. විද්‍යාවේ ජයග්‍රහණ ප්‍රාග්ධනය හිමි ධන කුවේරයන්ගේ ධනය වැඩිකිරීමට ඔවුන්ගේ ජීවිත සැපවත් කිරීමට හා රාජ්‍යයන්හි ශක්තිය පෙන්වීමට යොදා ගනු ලබද්දී පොදු ජනතාවට එම ජයග්‍රහණ අහිමි වී තිබේ. වත්මන් ඛේදවාචකය එයයි.

### චන්ද්‍රයාන් 3 හා ඉන්දියානු ජනයා

චන්ද්‍රයාන් 3 නැමති අභ්‍යවකාශ යානය සඳ මතට ගොඩබැස්සවීම ඉන්දියාවේ විශාල ජයග්‍රහණයක් බව සැබෑය. එහෙත් චන්ද්‍රයාන් 3 සඳ මතුපිටට ගොඩ බසිද්දීත් ඉන්දියානු ජනයා සිටින්නේ කෙබඳු තත්වයකද?

සමහර වාර්තා පෙන්වා දෙන ආකාරයට ඉන්දියාවේ ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් ජීවත්වන්නේ දිළිඳුකමේ රේඛාවෙන් පහළය. දිනකට ඇමරිකානු ඩොලර් 01කට වඩා අඩු ආදයම් ලබන (අන්ත දිළිඳු) ඉන්දීය ජනගහනය 34%ක් පමණ වේ. දිනකට ඩොලර් 02ට අඩුවෙන් උපයන ඉන්දීය ජනගහනය 68.8%කි. ඉන් පැහැදිලි වන්නේ ඉන්දියාවේ විශාල දුප්පත්කමක් තිබෙන බවය.

ඉන්දියාව තුළ දිළිඳුකම හා බැඳුණු තවත් ගැටලු රැසක් තිබේ. ඉන්දියාවේ ජනගහනය මිලියන 99 කට පිරිසිදු පානීය ජලය ලබාගැනීමට මඟක් නැතිව පවතී. එසේම සනීපාරක්ෂක ප්‍රශ්නද ඉන්දියාවේ විශාල ගැටලුවකි. වැසිකිලි නැති ජනගහනය ඉන්දියාවේ තවමත් විශාල අගයකි. බොහෝ ලෙඩ රෝග ඒ හා බැඳී ඇත. ස්ත්‍රී දූෂණවලට එක හේතුවක් ලෙසද සමාජ විද්‍යාඥයන් පවසන්නේ කාන්තාවන්ට ආරක්ෂිතව වැසිකිළි යාමට නොහැකිවීම හා රාත්‍රී කාලයේ එළිමහනට යාමට සිදුවීමය.

### සමාජ ගැටලුවල ඛේදවාචකය

එසේම ඉන්දියාවේ තවමත් ළමා විවාහ සිදුවේ. ග්‍රාමීය ජනතාව අතර තවමත් 44% ක් පමණ ළමා විවාහ සිදුවේ. ඒ නිසාම දරු උපතේදී මිය යන මව්වරුන්ගේ (දරුවන්ගේ) ප්‍රමාණය විශාලය. අනෙක් අතට ඉන්දියාවේ ජනගහනයෙන් මිලියන 2.7කට එච්.අයි.වී. වෛරසය ආසාදිත වී ඇති බව පැවසේ. ඉන් දෙලක්ෂ විසිදහසක් ළමුන්ය. එසේම නිවාස නොමැතිව පදික වේදිකාවල ජීවත්වන ජනතාවද විශාලය. කුලවාදයෙන් පීඩා ලබන, මිත්‍යා විශ්වාසවල එල්බ ගත් ජනගහනය තවමත් විශාලය.

රට තුළ එවැනි ඉතාම ඛේදනීය තත්වයක් පවතිද්දී සඳ ජය ගැනීම පිළිබඳව ඉන්දියාවට සතුටු විය හැකිද? සඳ ජය ගැනීමේ සතුටෙන් ජීවිතය විඳවන මිනිසුන්ගේ වේදනාව යටපත් කළ හැකිද? අප ඉදිරිපිට තිබෙන ගැටලුව එයයි. මේ තුළ බරපතළ සමාජ අසාධාරණයක් පවතී. ඒ, විද්‍යාවේ හා තාක්ෂණයේ ජයග්‍රහණ පොදු ජනයාගේ ජීවිත නගා සිටුවීමට නොයෙදීමය. නැතිනම් ඒ පිළිබඳ නොහිතීමය.


### ජනතාව සඳහා යෙදවිය යුතු විද්‍යාවේ ජයග්‍රහණ

මෙය ඉන්දියාවේ පමණක් නොව ලොව පුරාම පවතින ගැටලුවකි. මේ ලෝකයේ ජීවත්වන හා උපදින සියලු මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ඉටුකිරීමට තරම් ලෝකයේ විද්‍යාව තාක්ෂණය හා නිෂ්පාදනයන් දියුණුවී තිබේ; වර්ධනය වී තිබේ. එහෙත් සමාජ අසාධාරණය පවතින ආර්ථික ක්‍රමයත් නිසා ලාභ ලැබීම එකම අරමුණ කරගත්, දේපළ පෞද්ගලිකව ගොඩගැසීම එකම අරමුණක් කරගත් සමාජයක පවතින විෂමතාවය නිසා ජනතාවට ලැබිය යුතු විද්‍යාවේ හා තාක්ෂණයේ ජයග්‍රහණ ජනතාවට තවමත් අහිමි වී තිබේ.

ලෝකයේ දියුණු යයි කියනු ලබන රටවල වැඩිම දක්ෂ විද්‍යාඥයන් පිරිසක් තවමත් සේවය කරන්නේ අවි ආයුධ නිපදවන කර්මාන්තවලය. ආහාර නිපදවීමට වඩා, මිනිස් අවශ්‍යතා නිපදවීමට වඩා වැඩිමනත් ආයුධ නිපදවීමට යොදන්නේ ඇයි? ආයුද නිෂ්පාදනය වැඩිම ලාභ ලැබිය හැකි ජාවාරමක් නිසාය.

එබැවින් විද්‍යාවේ ජයග්‍රහණ, මිනිසා විසින්ම සොයාගත් විද්‍යාවේ ජයග්‍රහණ මානව වර්ගයාගේ යහපත සඳහා යොදවන ක්‍රමයක් දැන් අවශ්‍යව තිබේ. ඉර, හඳ, තාරකා ජයගන්නා අතරම මේ පෘථිවියේ ජීවත් වන මිනිසුන්ගේ මූලික අවශ්‍යතා ඉටුකිරීම සඳහාද විද්‍යාවේ හපන්කම් යොදවන සමාජ ක්‍රමයක් ඉක්මනින්ම මිහිමත නිර්මාණය කළ යුතුව තිබේ.





"විද්‍යාවට රජ මාවතක් නැත. එහි දුෂ්කර මාර්ග ඔස්සේ ඉහළට නැගීමෙන් වෙහෙසට පත් වීමට බිය නොවන අයට පමණක් එහි දීප්තිමත් මුදුන් වෙතට යාමට අවස්ථාව ලැබෙනු ඇත."

**කාල් මාක්ස්**
**ප්‍රාග්ධනය,**
**01 වෙළුම,**
**30 පිටුව**

# පොලිටිකල් පංතිය

පොලිටික්ක කාටත් කලින් පංතියට ආපු දවසක බර වැඩක හිටියෙ. පොත් ගොඩක් උස්සන් ඇවිත් කියවනවා. කියවනවා කිවුවට එකක් බලනවා... ඒක වහනවා... අනෙක පෙරළනවා. ඒක වහලා තව එකක් පෙරළනවා. ඉඳලා හිටල පොතක් පෙරළගන්න අමාරු වෙලා ඇඟිල්ලෙ කෙළ ගාන්න ඔළුව ඉස්සුවොත් තමයි පංතියට එන ළමයෙක්ට ගුඩ් මෝනිං - ආයුබෝවන් පාරක් හුවමාරු වුණේ. ළමයි එකා දෙන්නා ඇවිත් පංතිය පිරිල ටිකක් වෙලා යනකම් පොලිටික්ක දන්නෙ නෑ.

"ගුඩ් මෝනිං සර්..." පොලිටික්ක පොතකින් පොතකට මාරු වෙන අතරෙ, ඒ වෙනකම් ගුඩ් මෝනිං කියා ගන්න බැරිවුණ වසන්තිය ටිකක් හයියෙන් කිවුව.

"ආ... ආයුබෝවන් ළමයිනේ... ඔයාලා ඔක්කොම ඇවිල්ලනෙ... මට කිවුවෙත් නෑනෙ" පොලිටික්ක විස්සෝපෙන් කිවුව.

"ගුඩ් මෝනිං සර්... අපි ඇවිල්ල හිටියෙ. සර් බර වැඩක හිටපු හින්ද කරදර කළේ නැහැ" අනුරුද්දියත් හිතේ හිරකරගෙන හිටපු ගුඩ් මෝනිං පිටකළා. "මම බලාගෙන හිටියෙ සර් ඔළුව උස්සනකම්"

"මොනවද සර් ඔය පොත්" කනිය ට්‍රයල් බෝලයක් දැම්ම.

"මේවා බොහොම වටින පොත්" පොලිටික්කත් 'ගෙදර යන ගමන්' උත්තරයක් දුන්න.

"සර් ඕවා ඔක්කොම කියවලා තියෙනවද?" මංජුව බෝලෙ දැම්මෙ විකට් එකටම වගේ.

"ඔක්කොම කියවල නෑ. තැන් තැන්වලින් බලල තියෙනව... ඔක්කොම කියවන්න වෙලාවක් නෑ ළමයිනේ..." පොලිටික්ක ආරක්ෂාකාරී පියවරකට ගියා.

"ඔය ළමයි දන්නවද මේ කියන්නෙ මොකක්ද කියල" පොලිටික්ක කිවුවෙ හැරෙන්නෙත් නැතුව කළු ලෑල්ලට අත් දික්කරලා.

"ඔය කළු ලෑල්ලනෙ සර්... ඕකට කියන්නෙ බ්ලැක් බෝඩ් එක" කනිය පැන්න නෝන්ඩියක් දාගෙන.

"කළු ලෑල්ල කියන එක අහන්නත් දෙයක්ද ළමයිනේ... මං ඇහුවෙ ඒකෙ ලියල තියෙන දේ" පොලිටික්ක තනියම හිනා වුණේ ළමයි ඇණ ගත්ත කියල හිතලා.

"මුකුත් ලියල නෑනෙ සර්..." පැනල දෙන්න බලාගෙන හිටපු වසන්තිය කිවුවෙ බොක්කෙන්.

"මේකෙ ලියල තිබ්බ එක මැකුවෙ මොකාද?" හොඳ කළුවට තිබුණු කළු ලෑල්ල දිහා බලාගෙන පොලිටික්ක කේන්තියෙන් වගේ කිවුවට වෙලා තිබුණෙ ඇඬෙන වැඩක්.

"මං දන්නෙ නෑ, සර් අද උදේ ලියපු එකක් කියල... ආපු ගමන් මං හොඳට මකල තිබ්බ... සර්ට ලියන්න..." අනුරුද්දිය නිදහසට කරුණු කිවුවෙ රනිල් බටලන්ද කොමිසමේ සාක්කි දෙනවටත් වඩා අසරණව.

"මම ලියල තිබුණෙ 'රාජ්‍යතාන්ත්‍රිකභාවය' කියල. ඔය ළමයි අහල තියෙනවද ඒ වචනෙ. රාජ්‍ය...තාන්ත්‍රික...භාවය..." පොලිටික්ක බර කරල කිවුවෙ ළමයි දැන් කොර වෙලා ඇති කියල හිතල. පොලිටික්ක පොතක් පෙරළගෙන අතත් තියා ගත්ත 'අනේ දන්නෙ නෑ සර්' කිවුව ගමන් කියන්න.

"ඔය කියන්නෙ ඩිප්ලොමැසිනෙ. සාමාන්‍ය තේරුම සංවේදී උපායශීලී විදිහට මිනිස්සුත් එක්ක ගනුදෙනු කරන කලාව කියන එක. ඒත් ඇත්තම තේරුම එක රටක නියෝජිතයො තවත් රටක් එක්ක ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා ගන්න පාවිච්චි කරන හැම විදිහකම ක්‍රියාකරකම් හැකියාවන් කියන එක..." සමන එක හුස්මට කියල දැම්ම.

"ඔය ළමයි මම හිතුවට වඩා දන්නවනෙ... මං මේ තේරුම් කරන්න ආවෙ ඕක" පොලිටික්ක පෙරළගෙන හිටපු පොත වැහුවෙ බලාපොරොත්තු සුන් වෙච්ච හුස්මක් එක්ක.

"ඔය තේරුම් ඉස්සර වෙන්න ඇති... දැන් තේරුම ඒක නෙමෙයි මං හිතන්නෙ" මංජුව කොණක් පාද ගත්ත.

"එහෙනම් මොකද්ද ළමයො" පොලිටික්ක ඇහුවෙ උනන්දුවෙන්.


"දැන් රාජ්‍යතාන්ත්‍රිකභාවය කියන්නෙ විකිණීම, පැවරීම, මොන ආකාරයන් හෝ අයිතිය අත්හැරීම" මංජුව බොහොම සංසුන්ව කිවුවම හැමෝම වගේ හිතුව ඒකෙත් ඇත්තක් ඇති කියල.

"බ්‍රිටැනිකා විශ්වකෝෂෙ එහෙම තියෙනවද?" වසන්තිය හැබෑවට ගත්ත.

"නෑ... ඒකෙ එහෙම නෑ... මංජු කිවුවෙ රනිල්ට අනුව තේරුම... රනිල් මහත්තය හිතාගෙන ඉන්නෙ එහෙම. ඒකනෙ ඉන්දියාවෙ ගිහින් ඒ තේරුම එන විදිහට ලංකාවෙ දේවල්වල අයිතිය අත්හරින්න පොරොන්දු වෙන්නෙ" සමන කතාව සම්පූර්ණ කරනකොට පොලිටික්ක ගෙනාපු පොත් ටික එක පිට එක ඇහිරුව ආපහු ගෙනියන්න.

## කවුළුව හැර තබමි

# 'බච්චන්ගේ' මාසයෙන් සාහිත්‍ය මාසයට!



ධනවාදය මිනිස් සමාජය වාණිජකරණය කරයි. මෙම තත්වය සාහිත්‍යය සහ සෙසු කලා මාධ්‍යවලටද අදාළය. ධනවාදයේ මේ අවධිය තුළ සාහිත්‍යය පමණක් නොවේ; ඊට සහභාගි වන නිෂ්පාදනය (කෘතිය) මිලට ගන්නා සමාජයද වාණිජකරණයට ලක්වෙයි.

සැප්තැම්බර්වලදී තවත් සාහිත්‍ය මාසයක් උදාවිය. දළදා පෙරහැර මෙන් සුපුරුදු පෙරහැරට සුපුරුදු කෙළි සෙල්ලම්ද, සුපුරුදු බෙරවයන්නෝද, නටන්නෝ සහ නැටුම් සමග සාහිත්‍ය පෙරහැරද, මෙවරත් අනාදිමත් කලක පටන් ගිය, මග දිගේම ගමන් කරනු ඇත. ඉන්පසු සැබෑ අරුතින් ගන්නෝ තමන් තමන්ටම සම්මාන පුදකරමින් එය අවසන් වෙනු ඇත.

ලෝක 'බච්චන්ගේ' හෙවත් සුරතල් බල්ලන්ගේ දිනය යෙදී තිබුණේ අගෝස්තු මාසයේය. ලංකාවේද බූෂුවාවරුන් එය තැන තැන සැමරූ බව අපට අසන්නට ලැබුණි. ලාංකේය ධනවාදය තුළ අර බලු සැමරුමට දුන් වටිනාකමවත් සාහිත්‍යයට ලැබේදැයි අපට නම් ප්‍රශ්නයකි.

නූතන ධනවාදී වෙළඳපොළ තුළ විශේෂයෙන් යුරෝපා රටවල "Literary Agent" ලා නමින් කොටසක් සිටිනා බව දැන් ලෝකයම දන්නා කරුණකි. සාහිත්‍ය කෘති ප්‍රමෝට් කර, ඊට අදාළ විශාල වෙළඳ වටිනාකමක් හිමිකර දීම ඔවුන්ගේ මුඛ්‍ය කාර්යයයි. ඒ සඳහා ඔවුන්ට හොඳට ගෙවිය යුතුය.

එසේ කළ නොහැකි අයට තමන් මොන තරම් උසස් සාහිත්‍ය කෘතියක් නිෂ්පාදනය කළද එයට වෙළඳපොළ සොයා ගැනීම අතිශය අසීරුය. ලංකාවටද මෙය බෝ නොවී තිබිය නොහැකිය.

ලෝකයේ "පජාතම" ධනවාදය ක්‍රියාත්මක රටවලින් ප්‍රමුඛ පෙළේ රටකි ශ්‍රී ලංකාව. ඉදින් එවැනි තැනක සාහිත්‍යාලංකාර ගැන පමණට වඩා නද දී පලක් නැත. මිනිසාට මිනිසෙකු ලෙස ජීවත් විය හැකි සමාජයක් නිර්මාණය කළ දාට අපටද උසස් මානවීය සාහිත්‍යයක් ගැන උදම් ඇනිය හැක.

# "පල්වතුර වළවල් ඉසින විට වටිනාකම් නොලැබේ"

ශ්‍රේෂ්ඨ සම්භාවනීය මිනිසෙකු පක්ෂය තුළ වැඩ කරමින් සිට මෙලොව හැර ගියවිට ඉන් අපට දැනෙන්නේ විශාල අඩුවකි. හිස් බවකි. එහෙත් දේශපාලන අශ්ලීලයෙකු, අශිෂ්ටයෙකු, දෙබිඩ්ඩෙකු, පක්ෂය හැරයාම පක්ෂයට ආලෝකයකි; පක්ෂය එක් වටයකින් පිරිසිදු වීමකි.

දිනෙන් දින ජයග්‍රහණය කරා ඉදිරියට ඇදෙන ජ.වි.පෙ. ප්‍රමුඛ ජාතික ජන බලවේගයේ වර්ධනය පිළිබඳව අද එහි සියලු පංති සතුරු කඳවුරු සහ අවස්ථාවාදී වාම කල්ලි, මෙන්ම මධ්‍යස්ථ මතධාරී හොර පිරුවට පොරවා ගත් පාලකයන්ගේ "වැග්නර්" භටයින්ද භීතියෙන් භ්‍රාන්තියට පත්ව තිබෙන අන්දම සුලභ දසුනක් වී තිබේ. මෙහි විශේෂ කාරණය නම් පක්ෂය තුළ විවිධ දේශපාලන වැහැරීම් හා දේශපාලන සදාචාර පරිහානියන්ට ලක්වූ උදවිය පක්ෂයෙන් පන්නා දැමූ පසුව ශුද්ධ වූ 'වාම' වෙස් පැළඳ පක්ෂයට දිවා රෑ නොබලා මඩ අවලාද නගන කල්ලි බවට පත්ව තිබීමය; ජුගුප්සාජනක ලෙස හැසිරෙමින් සිටීමය.

තම ස්වාමිවරුන්ගේ විධානය පරිදි මාමයිට් කුප්පිවල අසුරන ලද ලාභ සහ බාල වර්ගයේ ඩප්පි බෝම්බ අතැතිව ජ.වි.පෙ.ට පහරදීමට ගොස් ඒවා අතේ පත්තු වන ආධුනික භටයින් සේ ඔවුන් හත්පොළේ ගාගෙන, ඇඳුම්ද උනාදමා සිටින අයුරු දැන් ඔබට දැක බලාගත හැකිය. ලෙනින් වරක් මෙවැනි පන්නයේ භාදයන්ට කියූ දේම අපි ඔවුන්ට නැවත මතක් කර දෙමු.

"අති උදාරත්වයේ සිට තකතීරුකම දක්වා ඇත්තේ එක් පියවරකි."



# මේ සර්පයින් මුදා හරින කාලයයි!

ලාංකේය සමාජය පෙර නොවූ විරූ දේශපාලන පිම්මක් පැනීමට පෙර සූදානමක සිටින සෙයක් දිස්වෙන නිමේෂයකි මෙය. එය නිතැතින්ම ප්‍රගතිශීලී දේශපාලන පිම්මක පෙරහුරුවක් බව අපි නොවලහා ප්‍රකාශ කර සිටිමු. මෙවන් නිමේෂයකදී ප්‍රතිගාමී බලයන් සියල්ල ඊට එරෙහිව පෙළගැසී සටනට සූදානම් වන අන්දමද අලුත් දෙයක් නොවේ. එහිදී ඔවුහු මෙතෙක් තම සහායක බල ඇණි ලෙස වේදිකාවට කැන්දූ සුපුරුදු අවතාර නැවත වටයකින් කැඳවමින් සිටිති. ආගම්වාදය, ජාතිවාදය ඉන් අති බිහිසුණුම අවතාරයන්ය. අපේ මේ කියන්නට යන්නේ ඒ ගැන නොවේ. මෙවැනි අවස්ථාවක සමාජයට නිවැරදි දිශානතිය පෙන්වන පෙරගමන්කරුවා යයි කියා ගන්නා ලාංකේය බහුතරයක් ජනමාධ්‍යවල මේ මොහොතේ හැසිරීම ගැනය.




"පැත්ත ගියත් ඇත්ත කියන", "කට කැවත් බොරු නොකියන", "බෙල්ල ගියත් කඳ ෆයිට්" වැනි ලේබල් ගසාගෙන දිවා රෑ පම්පෝරි ගසන මාධ්‍යයන්හි අද ඇත්ත භාවිතය කුමක්ද?


මේ මොහොතේ ජන මාධ්‍යවල හැසිරීම සමාජයේ විනිසුරන්ගේ ජීවිතවලට ඉතාමත් බලපෑම් සහගත යථාර්ථයක් වීම කාට සීරියස් නොවුණත් ප්‍රගතිගාමී දේශපාලන ව්‍යාපාරයකට නම් එය සමාජීය අර්ථයෙන් විමසා බැලීම අත්හළ නොහැකි කාර්යයකි. මෙහිදී විද්‍යුත් මාධ්‍ය විශේෂය. ජනමාධ්‍ය යනු අර්ථාන්විත දෙයකි. අර්ථාන්විත වන්නේ නිසි ලෙස භාවිතා කළහොත්ය. සමාජ ප්‍රගතිය, සංවර්ධනය සඳහා පාවිච්චි කළොත්ය. නමුත් අවාසනාවකට ලංකාවේ තවමත් වැඩි හරියක් ඇත්තේ "නාග දරණ" "පැණි ධම්මික" වර්ගයේ විද්‍යුත් නාලිකාය.

අද සන්නිවේදනයට වඩා එහි ප්‍රාසාංගිකත්වය විශාල වී ඇත. එහිදී ප්‍රාසාංගිකත්වය ප්‍රගුණ කළ නාලිකාවලට ඕනෑම බොරුවක් ඇත්ත කර විකිණිය හැකිය. මේ තුළ සිදුවන දෙය නම් ජන මාධ්‍යවල තිබිය යුතු සත්‍යවාදී ගුණය සහ ජනනාත්මක විවේචනය අතුරුදහන් වීමය. එනිසා මුදල් තිබෙන ඕනෑම පල් හොරෙකුට අද චැනල් අයිතිකාරයෙකු විය හැකිය. ඔහුගේ වුවමනාවනට සරිලන පරිදි හැසිරෙන ඕනෑම ගිරාපෝතකයෙකුට වසරේ ජනමාධ්‍යවේදියා බවටද පත්විය හැකිය. සම්මාන දෙන්නේත්, සම්මාන ගන්නේත් එකම කට්ටියය. ස්වාමියාගේ වුවමනාවට මිනිසුන්ට හොඳින්ම අන්දවන්නේ කවුද? වසරේ හොඳම ජනමාධ්‍යවේදියා ඔහුය. හොඳම චැනලයද ඔවුන්ගේමය. ලංකාවේ ළඟ ළඟ එන දේශපාලන පරිවර්තනයේදී වඩාත්ම විෂකුරු සර්පයින් මුදා හරින චැනල් ගැන අවධානයෙන් සිටීමද එම පරිවර්තනයට අත්‍යවශ්‍යම කොන්දේසියකි.

2023 අගෝස්තු 24

# කල්ලි පාලනයෙන් ක්‍රිකට් ආයතනය ගලවා ගත යුතුයි

*(2022 ක්‍රිකට් ආයතනය විසින් සිදුකළ ඕස්ට්‍රේලියානු සංචාරයේදී සිදු වූ අක්‍රමිකතා පිළිබඳ විවාදයට සහභාගි වෙමින්)*



ජාතික ජන බලවේගයේ නායක, පාර්ලිමේන්තු මන්ත්‍රී
**අනුර කුමාර දිසානායක සහෝදරයා**

අපට විශාල ජයග්‍රහණ නැති රටක්. අපට ජාත්‍යන්තර වශයෙන් සතුටු විය හැකි ජයග්‍රහණ විශාල ප්‍රමාණයක් රැගෙන දුන් ක්‍රීඩාවක්, ක්‍රිකට් ක්‍රීඩාව. අපේ තරුණ පරම්පරාවත්, පොදු ජනතාවත් එක්ක ඉතාමත් සමීප සංස්කෘතිකමය සබඳතාවයක් මේ ක්‍රීඩාව සමග තිබෙනවා. නමුත් පසුගිය කාලයේ මේ ක්‍රිකට් ක්‍රීඩාවට අත්පත් වී ඇති ඉරණම පිළිබඳ කවුරුවත් සතුටු වෙන්නේ නැහැ. අපට වසර ගණනාවකට පසුව ලෝක කුසලානය වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ තරගවලට යන්න සිදුවුණා. ඒක හොඳ තත්වයක්ද? ඒක හොඳ තත්වයක් නොවෙයි. ඉතාමත් පහළ තත්වයක තිබුණු රටවල්වලට අපි පරාජයට පත්වුණා. සමහර තරගවල අපි පරාජයට පත්වුණු ආකාරය ඒවා කිසිසේත්ම අනුමත කළ හැකි තත්වයන් නොවෙයි.

ක්‍රීඩාව වැටිලා තිබෙනවා. කවුරුත් පිළිගන්නවා. ක්‍රීඩකයන්ගේ විනය පිළිබඳව බරපතළ චෝදනා එනවා. තරුණ ජවය තිබෙන කණ්ඩායමක්, ළමයි, ඔවුන්ට ජීවිතය පිළිබඳ විශාල අත්දැකීම් නොතිබෙන්නට පුළුවන්. ඒ ගොල්ලන්ගෙන් යම් දේවල් සිදුවිය හැකියි. නමුත් ඒවා පාලනය කරන්න ඕනෑ. ඒ විනය, ආදර්ශය, මෙහෙයවීම ක්‍රිකට් පාලක මණ්ඩලය විසින් දිය යුතුයි. පාලක මණ්ඩලය පෙන්නුම් කරන්නේ මෙවැනි හැසිරීමක් නම්, ඔවුන්ගේ වයසට හෝ තරාතිරමවලට හෝ මුහුකුරායාමට කිසිසේත්ම නොගැලපෙන හැසිරීමක් නම්, ඔවුන් විසින් හසුරුවන දරුවන්ට කුමක් වේද? අද ක්‍රිකට් ක්‍රීඩාව පත්වී තිබෙන ඉරණමට සැලකිය යුතු ප්‍රමාණයෙන් පාලක මණ්ඩලය වගකියන්න ඕනෑ. ඒකෙන් ගැලවෙන්න ඔවුන්ට කිසිසේත්ම හැකියාවක් නැහැ. එපමණක් නොවෙයි එල්ල වී තිබෙන මූල්‍ය චෝදනා 'ටී ට්වෙන්ටි' කුසලානය සඳහා ඕස්ට්‍රේලියාවේ සංචාරය පිළිබඳ විගණන වාර්තාවයි මේ. සංචාරයක විගණනය මෙහෙම නම්, සමස්ත පාලක මණ්ඩලයේ ක්‍රියාකාරිත්වයේ විගණනය කෙසේ වේවිද?

ඒ විගණනයෙන් පෙන්නුම් කරන කරුණු මොනවාද? ඒ විගණන විමසුමේ තිබෙන පරිදි, සභාපතිවරයා මිලියන 11ක්, ලේකම්වරයා මිලියන 5.4ක්, උපසභාපතිවරයා මිලියන 5.1ක්, උප සභාපතිවරයා මිලියන 4.7ක්, වැය කරනවා. මේ වැය කිරීමේ ආකෘතිය දෙස බලන්න. මේවා භාණ්ඩ මිලදී ගැනීමකදී හෝ පාරක් ඉදිකිරීම් වගේ දේවල් සඳහා නොවෙයි, හොටල් වියදම්. ක්‍රිකට් ආයතනයේ මුදල් තමන්ගේ පෞද්ගලික, කෑත, මජර සුඛවිහරණය වෙනුවෙන් කරන ලද නාස්තිකාර වියදම් බවයි මේවායින් පෙනනුම් කරන්නේ. මේ පාලක මණ්ඩලයට පුළුවන්ද, විනය සහිත ක්‍රිකට් කණ්ඩායමක් පවත්වාගෙන යන්න. මිලියන 60කට වඩා වැය කර තිබෙනවා. බැට් එකක්, බෝලයක්, මිලදී ගන්න සොරකමක් නොවෙයි.තමන්ගේ ජීවිතය විවිධාකාරයෙන් පෝෂණය කර ගැනීම සඳහා මේ මුදල් වැය කර තිබෙනවා. මෙවැනි පිරිසකට පුළුවන්ද තරුණ කණ්ඩායමකට නායකත්වය දෙන්න. එපමණක් නොවෙයි ඔවුන් පැමිණ කියන්නේ මොකක්ද? "මේ ශ්‍රී ලංකා ක්‍රිකට්. ආණ්ඩුවට අයිති නහැ." මේ ශ්‍රී ලංකන් ක්‍රිකට් තමයි. ජයන්ත ධර්මදාසටත්, ෂම්මි සිල්වාටත් වුවමනා නම් "ජයන්ත ඇන්ඩ් ෂම්මි" නමින් ක්ලබ් එකක් දාගන්න"

අයි.සී.සී. එක ක්‍රිකට් ආයතනයට ස්වාධීනත්වය ලබා දුන්නේ ඇයි? ස්වාධීනත්වය දෙන කොට ආණ්ඩු විසින් අනිසි ලෙස කරන මැදිහත් වීම්, ක්‍රිකට් ක්‍රීඩාවට බාධා වීම් නතරවීම ඔවුන් අපේක්ෂා කළා. ඒකට පමණයි ස්වාධීනත්වය දුන්නේ. මේ 'ශ්‍රී ලංකන් ක්‍රිකට්'. තරගාවලි ලැබෙන්නේ ලංකාවට. ජයන්තගේ හරි ෂම්මිගේ හරි ක්‍රිකට්වලට නොවෙයි. මේක ගජමිතුරන්ගේ සමාගමක් නොවෙයි. ශ්‍රී ලංකාවේ සමාග මක්. පාර්ලිමේන්තුවේ සම්මත කරන ලද පනතකින් ඔවුන්ට ස්වාධීනත්වය ලබාදී තිබෙනවා.

ඔවුන් මාධ්‍ය සාකච්ඡාවකදී අඩුම තරමින් තමන් කවුද කියලවත් ඔවුන් දන්නේ නැහැ. හිස උදුම්මාගත්, උද්දච්ච, කිසිකෙනෙකුට ඇහුම්කන් දෙන්නේ නැති, පාර්ලිමේනතු මන්ත්‍රී කෙනෙක් ඔවුන් ගැන කී විට ඒ මන්ත්‍රී කවුද? මොකක්ද? දන්නෙත් නැහැ කියනවා. එවැනි උද්දච්ච කණ්ඩායමක්. ක්‍රිකට් ක්‍රීඩාව මේ වගේ තත්වයට පත්වෙන්න වර්තමාන පාලක කණ්ඩායම වගකියන්න ඕනෑ. අයි.සී.සී. එක ස්වාධීනත්වය අපේක්ෂා කළේ, මෙවැනි දේ සිදු නොවෙන්න. ඒවා සිදුවෙනවා නම්. අයි.සී.සී. එකට ගිහින් අපි කියන්න ඕනෑ. 'ඔබතුමන්ලා අපේක්ෂා කළ මේ වගන්ති, ඒ ආකාරයෙන් සිදුවී නැහැ. ඒකට හාත්පසින් දෙයක් සිදුවී තිබෙන්නේ' කියලා. ඒ නිසා මේක නිසි පරිදි මෙහෙයවෙන, නීති සම්පාදනය කිරීම සඳහා අවස්ථාව ගත යුතුයි. දකුණු අප්‍රිකාවේ මෙවැනිම ප්‍රශ්නයක් ආවා. ව්‍යවස්ථාව වෙනස් කළා. වෙනස් කිරීම පිළිබඳව ක්‍රීඩා අමාත්‍යවරයා අයි.සි.සී. එකට දැනුම් දුන්නා. එපමණයි කළේ.

අපේ ක්‍රිකට් ක්‍රීඩාව කාලාන්තරයක් තිස්සේ 'ගැන්' එකක් අතේ තිබෙන්නේ. ඡන්දවලින් ස්වාධීන මිනිස්සු පත්වෙන්නේ නැහැ. කාටවත් එන්න බැහැ. අපේ රටේ ප්‍රධානම ක්‍රීඩකයෙක් වන මුරලිදරන් කීවේ "මට ජනතාවගෙන් ඡන්දෙ ඉල්ලලා මන්ත්‍රීවරයෙක් විය හැකියි. හැබැයි මට කවදාවත් ඡන්දෙ ඉල්ලලා ක්‍රිකට් බෝර්ඩ් එකට එන්න බැහැ" කියලා. මේකෙ කල්ලි කිහිපයක් තිබෙනවා. එක් එක් ස්වාධීන පුද්ගලයන්, තමන්ගෙ හැකියාවන්, ආදර්ශයන්, වුවමනාවන් මත ක්ලබ්වලින් ඡන්දෙ දීලා බෝඩ් එකට එයි කියලා, පොදුවේ සාමාන්‍යයෙන් ජනතාව විශ්වාස කරනවා. ඒත් එහෙම වෙන්නේ නැහැ. මේක කාලයක් තිස්සේ සිට 'මාෆියා ගැන්' එකක්. කල්ලි කිහිපයක් තිබෙනවා. 'තිලංගගේ කල්ලිය,' 'ධර්මදාසගේ කල්ලිය', 'ෂම්මිගේ කල්ලිය', 'උපාලිගෙ කල්ලිය', මේ තිබෙන්නේ ගැන්ග්ස් කිහිපයක්. හෙට නිලවරණයක් තිබ්බත් මේ දූෂිත මාෆියා ගැන් එකක් තමයි මෙහි බලය ගන්නේ. හේතුව මොකක්ද? මේකෙ අධික මුදල් සම්භාරයක් සැරි සරනවා. ඒ මුදල් තමන්ට ඕන ආකාරයට වියදම් කිරීමට බලයක් ලබාදී තිබෙනවා. සතුටු කිරීම සඳහා ඇති තරම් මුදල් පොම්ප කිරීමට ලැහැස්ති වෙලා ඉන්නවා. ඒ නිසා මේ 'ගැන්' එකෙන් මේක බේරා ගන්න ඕනෑ.

දැන් ශ්‍රේෂ්ඨාධිකරණයේ හිටපු විනිසුරු චිත්‍රසිරි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත්කර තිබෙනවා. මම ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ යෝජනාව කුමක්ද? කොහොමද අපි ස්වාධීන සාමාජිකයන් මේක තුළට ගේන්නේ, කියන එක. මේ කිසිකෙනෙක් ස්වාධීන නැහැ. ඔවුන් එකට සාකච්ඡා කරලා, එකට කුමන්ත්‍රණ කරන, එකට හොරකම් කරන, එකට එකතුවෙලා තිබෙන, මාෆියා කණ්ඩායමක්. තවදුරටත් මේ මාෆියා කණ්ඩායමට අපි ක්‍රිකට් ක්‍රීඩාව යටත් වෙන්න දෙනවාද? මේ මාෆියා කණ්ඩායමෙන් බිඳිනවාද? යන ප්‍රශ්නය අප හමුවේ තිබෙනවා. බිඳින්න ඡන්දයක් තබා වැඩක් නැහැ. එසේ නම්, දැන් අනිවාර්යයෙන් අපි ක්‍රිකට් ආයතනය සඳහා මේ 'ගැන්' පත්වීම වැළැක්වීම සඳහා නීති සම්පාදනය කළ යුතුයි. නව ක්‍රමවේදයක් අවශ්‍යයි. ඒ නිසා චිත්‍රසිරි විනිසුරුතුමා විසින් ඉදිරිපත් කර තිබෙන්නේ අපි කෙසේද මේකට ස්වාධීන කණ්ඩායමක ගේන්නේ? කියන ප්‍රශ්නය. හේතුව ඡන්දයෙන් පත්වෙන්නේ ස්වාධීන කණ්ඩායමක් නොවන නිසා. ඡන්දයෙන් පත්වෙන්නේ කල්ලි. කිසිවෙකුගේ අණසකට යටත් නොවෙන කල්ලි. කල්ලි හදාගෙන ක්‍රිකට් ක්‍රීඩාවත්, ලංකාවේ කීර්තියත්, ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ කීර්තියත් නැති කරන ආයතනයක් ගොඩනගා තිබෙනවා. මේ කල්ලිවලින් ක්‍රිකට් ක්‍රීඩාව ගලවා ගත යුතුයි.

ඒ නිසා අපි පාර්ලිමේන්තුවෙ නීති සම්පාදනය කළ යුතුව තිබෙනවා. අනිත් ඒවාගෙත් එහෙම තමයි. මේ ආකාරයට මතුවී නොඑන්නේ මෙතරම් මුදල් ප්‍රමාණයක් සැරිසරන්නෙ නැති නිසා. ඒ නිසා ස්වාධීන සභිකයින් මෙම ආයතන සඳහා පත්කිරීමේ ක්‍රමවේදයක් පිළිබඳව අපි නැවත කල්පනා කළ යුතුව තිබෙනවා. අපි එතනට යමු. බාර් එකෙන් කෙනෙක් නොමිනේට් කළ හැකියි. අපේ චාටඩ් එකවුන්ට් ගණකාධිවරුන්ගේ පිළිගත් ආයතන තිබෙනවා. ඒකෙන් ගණකාධිකාරීවරයෙක් නම් කළ හැකියි. මෙසේ තෝරා ගන්නා නිල බෝඩ්වලින් සාමාජිකයන් හැටියට මෙතනට ස්වාධීනත්වය ගෙන ආ හැකියි. ඡන්දෙන් හතර පස්දෙනෙකුත් දෙන්න. 1996න් පස්සේ වසර 25ක් 26ක් කල්ලි අතේ මේ ක්‍රිකට් ආයතනය තිබෙන්නේ. මොන ඇමතිවරයා ආවත් එක්කෝ ඇමතිවරයා අල්ලා ගන්නවා. නැති නම් ඇමතිවරයා සමග හැප්පෙනවා. සිදුවී තිබෙන්නේ මෙයයි. ගොඩක් ඇමතිවරු යටත් වෙනවා. ටිකක් ඇමතිවරු හැප්පෙනවා. දැන් අමාත්‍යවරයා හැප්පෙන්නෙත් නැහැ, යටත් වෙන්නෙත් නැහැ, පතෝල වගේ. මේ කල්ලි පාලනයෙන් ක්‍රිකට් ආයතනය මුදා ගැනීමට, දැන් තීන්දුවක් ගත යුතුයි. පළමුව ක්‍රීඩා පනත සංශෝධනය කරන්න. අදහසක් ආවා ආංශික කාරක සභාවල අදහස් ගැනීමට. පනත හදා ඉදිරිපත් කරන්න. ඊට පස්සේ අදහස් ගන්න. අදහස් අරගෙන පනත් හදන්න යනවා කියන්නෙ එය සිදුනොවෙන වැඩක්. පළමුව පනත හදන්න. ඊට පස්සෙ ක්‍රිකට් ව්‍යවස්ථාව පාර්ලිමේන්තුවට ගේන්න. අපි අනුමත කරමු.

අයි.සී.සී. එකට ලියන්න. අයි.සී.සී. එක කියන්නේ දඩ බල්ලෙක් නොවෙයි. රටේ ක්‍රිකට් ක්‍රීඩාව මෙහෙයවන ආයතන ස්වාධීනව පාලනය වීම තමයි ඔවුන්ගේ අපේක්ෂාව තිබෙන්නේ. අයි.සී.සී. එකට තිබෙන්නෙ නරක අත්දැකීම්. ආණ්ඩු මැදිහත්වෙලා මේවා විනාශ කළා. ඒක තමයි ස්වාධීනත්වය අපේක්ෂා කළේ. දැන් අපට චිත්‍රයක් මවා පෙන්වන්න හදනවා අයි.සී.සී.එක දඩ බල්ලෙක් ලෙසට. අපට අයි.සී.සී. එකත් එක්ක තීරණ ගත හැකියි. දකුණු අප්‍රිකාව දැනුත් අරගෙන තිබෙනවා. එහි ක්‍රීඩා අමාත්‍යවරයා ව්‍යවස්ථාව හදලා දැනුම් දුන්නා. 2015 සිදත් වෙත්තමුනි අතුරු පාලක මණ්ඩලයේ සභාපතිවරයා හැටියට පත් කළා. තවදුරටත් මෙය කල් නොහැරිය යුතුයි. වාර්තාවක් ඇවිත් තිබෙනවා. එහි සාධනීය යෝජනා තිබෙනවා. අමාත්‍යවරයා හැටියට වාර්තාව මුළුමනින් පිළිගත යුතු නැහැ. කාර්ය මණ්ඩලයෙනුත් අදහස් අරගෙන මේ ක්‍රීඩා පනතත් මෙ ක්‍රිකට් ව්‍යවස්ථාවත් වෙනස් කරන්න ඕනෑ. කල්ලි අතේ තිබෙන ක්‍රිකට් ආයතන මුදා ගත යුතුයි.

ඇත පාසල්වන ඉතා දක්ෂ දරුවෝ ඉන්නවා. නමුත් රටට විශාල ජයග්‍රහණ ගෙනත් දීපු ක්‍රිකට් ක්‍රීඩාව කඩා වැටී තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩකයන් පිළිබඳව අපකීර්තිමත් චිත්‍ර හැදී තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩකයෝ දකින කොට ලියන ඒවා, කියන ඒවා අහන කොට ඔවුන් ක්‍රිකට් ගහයිද? මේ පාලක මණ්ඩලය වගකියන්න ඕනෑ.

## දූෂිත ප්‍රභූ පැළැන්තියට..

01 වැනි පිටුවෙන්

ප්‍රශ්න මත, ලයිට්, වතුර, ගෑස්, රස්සාව, භූමිතෙල් නැතිවුණ ප්‍රශ්නවලට එරෙහිව, තමන්ගේ පීඩාවට එරෙහිව ඉදිරියට ආවා.

අද පාලකයන් එක තැනකටත් ජනතාව එක තැනකටත් ගොනුවී තිබෙනවා. එදා පාලකයන් විසින් ජනතාව අතර, විවිධාකාරයේ බෙදීම් ඇති කළා. අද ලංකාවේ තීරණාත්මක පැහැදිලි බෙදුම් රේඛාවක් ඇති වෙලා තිබෙනවා. රනිල් වික්‍රමසිංහ, මහින්ද රාජපක්ෂ, රවි කරුණානායක, බැසිල් එක වේදිකාවකට ඇවිත් තිබෙනවා. පාලකයා තමන්ගේ ආරක්ෂාව වෙනුවෙන් එක වේදිකාවකට එකතු වෙලා තිබෙනවා. මෙතෙක් තිබුණේ සමාජයේ ඇත්ත බෙදීමක් නොවෙයි. උඩ ඉන්නවා අපව සූරා කන අතළොස්සක්. යට ඉන්නවා පොදු පීඩාවට පත්වුණු විශාල ජනතාවක්. මෙතෙක් එයාලගෙ පැළැන්තියට බලය එළලා තිබ්බා. ජාතික මැතිවරණයකදී ඔය සියලු දෙනා මාලිමාවට විරුද්ධව එක කඳවුරකට එනවා.

ඉදිරි දේශපාලනයේදී අතරමැද කවුරුත් නතර වෙන්නේ නැහැ. මේ දරුවන්ට, මෙයිට වඩා හොඳ ජීවිතයක් ලබාදෙන්න හොඳ ආණ්ඩුවක් හදන්න ඕනෙ. අපි මේ දූෂිත ප්‍රභූ පැළැන්තියෙන් මේ රට මුදා ගන්න ඕනෙ. ඒ සඳහා තිබෙන එකම ව්‍යාපාරය ජාතික ජන බලවේගයයි.

## බුද්ධි ගලනයට තල්ලුව...

07 වැනි පිටුවෙන්

15,000ක් (ලංකාවේ මුදලින් නම් ලක්ෂ 40ක් - 50ක පමණ) ඉහළ වැටුප් ලබන අයගෙනි. ඔවුන් විශාල කාලයක් ඉහළ වැටුප් ලබා ඇති නිසා ඔවුන්ට ජීවිතය ඒ බද්දට ගලපා ගැනීමට ගැටලුවක් නැත. අනෙක් අතට ඔවුන්ගෙන් අයකරන බද්දෙන් සමාජ ප්‍රතිලාභ රැසක් ඔවුන්ට හිමිය.

ලංකාවේ 2022 වසරේදී හඳුන්වා දුන් වැට් (VAT) බද්ද වසර දෙකකදී හැර ගතවූ 21 වසර පුරාම අඩු හෝ වැඩි කරමින් වාර්ෂිකව සංශෝධනය කර ඇත. ඒ හැම සංශෝධනයකටම අනුව ජීවිත පැවැත්ම වෙනස් කර ගැනීමට ජනතාවට නොහැකිය.

මේ සියලු කාරණා මගින් තහවුරු කරන්නේ රටකට අවශ්‍ය බදු ජනතා අපේක්ෂාවන්ට යෙදවීම වෙනුවට වත්මන් ආණ්ඩුවලට හැකිවී තිබෙන්නේ බදු මගින්ද ජනතාව රට හැරයාමට බලකිරීමටය. මේ තත්වයට වහා විසඳුම් සෙවිය හැක්කේ එකම විකල්පය ජනතාවාදී මහජන පාලනයක් මගින් ජනතාව පීඩාවට පත් කරන මේ දේශපාලන බලය වෙනස් කිරීමෙන් පමණි.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




නව නිදහස් අරගලයකට නව කතිකාවක් අරඹා...



සරුංගලේ වරල් සැලේ - හොඳම දේ දරුවන්ට




ක්‍රීඩාව තුළින් සාමූහිකත්වයට දිරි දී...



එක්සත් ජාතීන්ගේ නියෝජිතයන් හමුවී...



තරුණ දින වෙනුවෙන් නව දැනුම බෙදා ගෙන...



සෞඛ්‍යය බේරා ගැනීම වෙනුවෙන් වීදි බැස...

# ආර්ථික - දේශපාලන සටන් පාඨ ඒකාබද්ධ කළ ජාතික ව්‍යාපාරයක් ලෙස පාරට බහිමු!

**ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයා**



පංතිය සටන් කරන අවස්ථාවේදී මර්දනය නතර කළ නොහැකි බවත් සංවිධානාත්මක පංති අරගලයක් දියත් කළහොත් මර්දනය කළ නොහැකි බවත් පෙන්වා දුන් ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති කේ.ඩී. ලාල් කාන්ත සහෝදරයා, ජාතික අරගලයකට සූදානම් විය යුතුව ඇති බවත් ආර්ථික සටන් පාඨ සහ දේශපාලන සටන් පාඨ ඒකාබද්ධ කළ ජාතික ව්‍යාපාරයක් ලෙසට පාරට බැසිය යුතුව ඇති බවත් අවධාරණය කළේය.

ලාල්කාන්ත සහෝදරයා මෙසේ ප්‍රකාශ කළේ පසුගිය 22වැනි දින පැවති ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ කොළඹ දිස්ත්‍රික් සමුළුව අමතමිනි. මෙහිදී වැඩිදුරටත් අදහස් දක්වමින් ලාල්කාන්ත සහෝදරයා මෙසේද පැවසීය.

"මේ ඡන්ද ගේම ගහන්න අපට බැරි නම් වැඩක් නැහැ. අපට සම්පූර්ණ කරන්න මූලික කරුණු තුනයි තිබෙන්නේ. එකක් මතවාදී අරගලය. අපි එය සම්පූර්ණ කර තිබෙනවා. මේ රටේ ජනතාව දශක ගණනාවක සිට පීඩිතභාවයට එරෙහිව අරගල කර තිබෙනවා. අපි මතවාදී අරගලය සම්පූර්ණ කළ බවට තිබෙන සහතිකය තමයි ඡන්ද කොලේක එය ලකුණු කිරීමට ඉඩ නොදීපු එක. අපි මතවාදී අරගලය තව තවත් ශක්තිමත් කරමින් ඉදිරියට යා යුතුව තිබෙනවා. දෙක, සංවිධාන අරගලයට ඉස්සරහට ගන්න ඕනෑ. තුන්වෙනුව සටන් පාඨ සමගින් අපි පාරට බහින්න ඕනෙ.

අපි ඡන්ද සටනට සූදානම් වෙමු. ඡන්ද තියන්නේ නැති නම්, අපි සියලුම ජනතාව එකතු කරගෙන ආර්ථික සටන් පාඨ සහ දේශපාලන සටන් පාඨ ඒකාබද්ධ කරපු ජාතික ව්‍යාපාරයක් විදිහට පාරට බහිමු. එතනට සූදානම් වෙමු."

# ඉදිරියේ එළඹෙන්නේ ජනතාව ඉල්ලන පරිවර්තනය කර ගත යුතු වසරක්

**ජාතික ජන බලවේගයේ ජාතික විධායක සභික ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය**



ජනතාවට දැනෙන, ජනතාවට මුහුණ දීමට තිබෙන ප්‍රශ්නවලට විසඳුම් ලබා දිය හැකි නායකත්වයක් රටට අවශ්‍ය බවත් වේදිකාව තුළත් වේදිකාව ඉදිරිපිටත් සිටින්නේ එම නායකත්වය බවත් ප්‍රකාශ කළ ජාතික ජන බලවේග යේ ජාතික විධායක සභික ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය, සියලු දෙනාට රට වෙනුවෙන් කිරීමට විශාල වැඩකොටසක් ඉතිරි වී ඇති බවත් ඉදිරියේ එළඹෙනුයේ ජනතාව අපේක්ෂා කරන පරිවර්තනය කර ගත යුතු වසරක් බවත් පෙන්වා දුන්නාය.

ආචාර්ය හරිනි අමරසූරිය සහෝදරිය මේ බව කියා සිටියේ පසුගිය 13වැනි දින පැවති ජාතික ජන බලවේගයේ මොරටුව ආසන සමුළුව අමතමිනි. මෙහිදී තවදුරටත් කරුණු දැක්වූ ආචාර්ය හරිනි සහෝදරිය මෙසේද කියා සිටියාය.

"අද ජාතික ජන බලවේගය තුළින් මේ රටට අලුත් විදිහට දේශපාලනය කරන, අලුත් නායක නායිකාවන් ගණනාවක් බිහි කරන්න අපට හැකිවී තිබෙනවා. අපේ මේ ව්‍යාපාරය එන්න එන්න වර්ධනය වෙනවා. ඒ තමයි සාර්ථකත්වය. අලුත් විදිහට හිතන්න හැකි, ජනතාව වෙනුවෙන් නිවැරදි තීරණ ගත හැකි, ජනතාව තේරුම් ගත හැකි, ජනතා ප්‍රශ්න තේරුම් ගත හැකි, ජනතාව කොහෙද ඉන්නේ කියා තේරුම් ගත හැකි නායකයන් බිහිකරමින් මේ යන්නේ. මේ රටේ මේ ව්‍යසනයන්ට අපිට මුහුණ පෑමට සිදුවී තිබෙන්නේ එවැනි නායකයින් නැති නිසා තමයි. ඒ ප්‍රභූ දේශපාලන නායකත්වය නිසා තමයි අද ගොවීන්ට වතුර නොදී සිටින්නේ. මේ රටේ ගොවීන්ගේ කුඹුරට යන වතුර කපල නිදා ගන්න පුළුවන්ද? එහෙම කරන නායකයෙක් සමග කොහොමද මේ රටක් දියුණු කරන්නේ.

අපට විශාල වැඩකොටසක් ඉතිරි වී තිබෙනවා කරන්න. ඒ සඳහා සියලු දෙනාම එකතු වෙන්න. ධෛර්යමත් වෙන්න. අලුත් රටක් ගොඩනගන්න සියලු දෙනා එකතු වෙන්න. අපි වැඩකරමු. මේ රට වෙනස් කරමු.

# රටේ සම්පත් විකුණා දැමීමට ආණ්ඩුවට කිසිදු අයිතියක් නැහැ

**ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා**



දේශපාලන ප්‍රතිරූප පුම්බා ගැනීම වෙනුවෙන් සිදු කරන ලද විකාශනයන් වෙනුවෙන් රාජ්‍ය ආයතනවලින් රූපවාහිනියට මුදල් නොගෙවා තිබීමත් ගුණාත්මක වැඩසටහන් නිෂ්පාදනය අත්හැර දැමීමත් හේතුවෙන් මූල්‍ය අර්බුදයකට ඇද දමන ලද අයම එහි අර්බුදය පෙන්වා මුදල් සෙවීමට රූපවාහිනිය සතු ගුවන් කාලය විකිණීමට කටයුතු කිරීමට විරෝධය පළ කරන බව ප්‍රකාශ කළ ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටු සාමාජික වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා, රටේ සම්පත් මෙලෙස විකුණා දැමීමට ජනාධිපතිවරයා ඇතුළු ආණ්ඩුවට කිසිදු අයිතියක් නොමැති බව අවධාරණය කළේය.

වෛද්‍ය නලින්ද ජයතිස්ස සහෝදරයා මේ අදහස් පළ කළේ පසුගිය 14වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද ජනමාධ්‍ය හමුවකදීය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ වෛද්‍ය නලින්ද සහෝදරයා මෙසේද කියා සිටියේය.

"1982 අංක 06 දරන රූපවාහිනී සංස්ථා පනතෙන් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව පිහිට වූයේ ජපානයෙන් ශ්‍රී ලාංකික ජනතාවට ලැබුණු පරිත්‍යාගයක් හැටියටයි. අපේ රටේ ජනතාවගේ විනෝදාස්වාද කටයුතු සහ අධ්‍යාපනික කටයුතු පුළුල් කිරීම වෙනුවෙන් එය ලබා දී තිබුණා. පාලකයින් මේ වන විට රූපවාහිනිය කෙතරම් ඇදවට්ටා තිබෙනවාද කියතොත් සමහර මාසවල සේවකයින්ට වැටුප් ගෙවීමට පවා නොහැකි තත්වයක් පවතිනවා.

ආණ්ඩුවේ මැති ඇමතිවරුන් විසින් ආයතන බංකොළොත් කර ඉන් පසුව තමන්ගේ ගජමිතුරු ආයතනවලට විකුණා දැමීමට යුහුසුළුව කටයුතු කරනවා. ඖෂධ මිලදී ගැනීමේදී, තෙල් මිලදී ගැනීමේදී සහ විදුලිය මිලදී ගැනීමේදී 'හදිසි මිලදී ගැනීම්' යටතේ විවිධ ජාවාරම් සිදුකරනවා. තමන්ට හිතුමතයේ ජනතාවගේ සම්පත් විකුණා දැමීමේ එක්තරා ක්‍රියාවලියක් මේ තුළින් පැහැදිලි වෙනවා. ආර්ථික අර්බුදය හමුවේ රටේ ජනතාව ජීවිකාව සරි කර ගැන්මට පොර බදන අවස්ථාවේ තමන්ගේ බලය පාවිච්චි කර ජනතාවට අයිති සංඛ්‍යාත හිතුමතේ විකුණා දමන්න ඇමතිවරුන් සහ ජනාධිපතිවරයා ක්‍රියා කරනවා.

ජීවන අරගලය ඇතුළේ පවා මෙවැනි කටයුතු කෙරෙහි ජනතාවගේ අවධානය යොමු කළ යුතු බවත් අපි අවධාරණය කරනවා. රූපවාහිනී සංස්ථා සේවයන්ගේ පමණක් නොව රටේම ජනතාවගේ අවධානය මේ විකිණීමේ ක්‍රියාවලිය කෙරෙහි යොමු කරන ලෙස ඕනෑකමින් ඉල්ලා සිටිනවා."

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.